අ.පො.ස (උ.පෙළ) විභාගය - 2015

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2015

ඇගයීම් වාර්තාව

32 - ව්‍යාපාර අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

ව්‍යාපාර අධ්‍යයනය

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2015

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2015 වර්ෂයේ දී මෙම විභාගය සඳහා නව නිර්දේශය යටතේ 210340ක් පාසල් අයදුම්කරුවෝ ද 44851ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි විෂයය අභිමතාර්ථ හා විෂයය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂයය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂයය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2015 විභාගයේ ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටුවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා එලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2016 ජූනි 29
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

උපදේශකත්වය	:	ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	මනෝමි සෙනෙවිරත්න සහකාර විභාග කොමසාරිස්
සංස්කරණය	:	ආචාර්ය එම්.ඩී. පුෂ්පකුමාරි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය යූ.එල්.ටී.පී. ගුණසේකර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කැලණිය විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩබ්.එම්. සුදුබණ්ඩා වාණිජ - ගුරු උපදේශක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පස්සර. ඩබ්ලිව්.එම්. ඒකනායක වාණිජ - ගුරු උපදේශක ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය, බත්තරමුල්ල. ඩබ්.ඩී. රංජිත් ජයනාද කො/ ශාන්ත පීතර විද්‍යාලය, කොළඹ 04. ෂෙරීන් කණ්ඩම්බි මහ/ මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර වසන්ත ගාමිණී අබේසිංහ විශාඛා විද්‍යාලය, කොළඹ 05.
පරිගණක පිටපත සැකසුම	:	ඩබ්.ජී.ඩී. චතුරිකා දිසානායක පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවරය නිර්මාණය	:	වයි.එස්. අනුරාධි සංවර්ධන නිලධාරී

ඇතුළත පිටු

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර පිළිබඳ ව නිපුණතා වර්ධනය කර ගනියි.
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මගින් එයට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා ලබා ගනියි.
- ව්‍යාපාර හා ඊට සම්බන්ධ උපකාරක සේවා පිළිබඳ ව ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කරයි.
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත්, සංකීර්ණ විෂයය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා වර්ධනය කර ගනියි.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගනියි.
- ව්‍යාපාර පද්ධතියක ශ්‍රිත අතර සමෝධානිත බව පෙන්වා දෙයි.
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරත වීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා ගනියි.
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගනියි.
- සැලසුම් සහගතව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා ලබාගනියි.
- වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගනියි.
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා වර්ධනය කරගනියි.
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා ගනියි.

1.2. විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	43837	5345	49182
දෙමළ	8100	1196	9296
ඉංග්‍රීසි	1766	821	2587
එකතුව	**53703**	**7362**	**61065**

වගුව 1

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	5491	10.22	386	5.24	5877	9.62
B	9771	18.19	861	11.70	10632	17.41
C	17821	33.18	1905	25.88	19726	32.30
S	15405	28.69	2474	33.60	17879	29.28
F	5215	9.71	1736	23.58	6951	11.38
එකතුව	**53703**	**100.00**	**7362**	**100.00**	**61065**	**100.00**

වගුව 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	8295	1202	14.49	1552	18.71	2522	30.40	2224	26.81	7500	90.42	795	9.58
2. ගම්පහ	4911	542	11.04	882	17.96	1529	31.13	1425	29.02	4378	89.15	533	10.85
3. කළුතර	2250	264	11.73	379	16.84	728	32.36	650	28.89	2021	89.82	229	10.18
4. මහනුවර	2878	238	8.27	457	15.88	887	30.82	883	30.68	2465	85.65	413	14.35
5. මාතලේ	774	89	11.50	109	14.08	244	31.52	231	29.84	673	86.95	101	13.05
6. නුවරඑළිය	1048	51	4.87	156	14.89	384	36.64	344	32.82	935	89.22	113	10.78
7. ගාල්ල	2375	199	8.38	392	16.51	761	32.04	752	31.66	2104	88.59	271	11.41
8. මාතර	1321	165	12.49	256	19.38	400	30.28	348	26.34	1169	88.49	152	11.51
9. හම්බන්තොට	769	49	6.37	99	12.87	268	34.85	245	31.86	661	85.96	108	14.04
10. යාපනය	1022	91	8.90	151	14.77	348	34.05	293	28.67	883	86.40	139	13.60
11. කිලිනොච්චි	167	2	1.20	22	13.17	63	37.72	56	33.53	143	85.63	24	14.37
12. මන්නාරම	188	11	5.85	23	12.23	55	29.26	71	37.77	160	85.11	28	14.89
13. වව්නියාව	274	20	7.30	46	16.79	90	32.85	83	30.29	239	87.23	35	12.77
14. මුලතිව්	119	4	3.36	20	16.81	41	34.45	32	26.89	97	81.51	22	18.49
15. මඩකලපුව	745	31	4.16	104	13.96	273	36.64	225	30.20	633	84.97	112	15.03
16. අම්පාර	925	52	5.62	136	14.70	285	30.81	337	36.43	810	87.57	115	12.43
17. ත්‍රිකුණාමලය	583	28	4.80	88	15.09	183	31.39	183	31.39	482	82.68	101	17.32
18. කුරුණෑගල	2338	217	9.28	379	16.21	757	32.38	747	31.95	2100	89.82	238	10.18
19. පුත්තලම	1202	81	6.74	197	16.39	436	36.27	365	30.37	1079	89.77	123	10.23
20. අනුරාධපුරය	1124	100	8.90	176	15.66	374	33.27	369	32.83	1019	90.66	105	9.34
21. පොළොන්නරුව	542	33	6.09	78	14.39	182	33.58	185	34.13	478	88.19	64	11.81
22. බදුල්ල	1333	108	8.10	211	15.83	414	31.06	413	30.98	1146	85.97	187	14.03
23. මොනරාගල	553	52	9.40	97	17.54	195	35.26	160	28.93	504	91.14	49	8.86
24. රත්නපුරය	1935	147	7.60	302	15.61	673	34.78	608	31.42	1730	89.41	205	10.59
25. කෑගල්ල	1311	162	12.36	234	17.85	417	31.81	368	28.07	1181	90.08	130	9.92
සමස්ත දිවයින	**38982**	**3938**	**10.10**	**6546**	**16.79**	**12509**	**32.09**	**11597**	**29.75**	**34590**	**88.73**	**4392**	**11.27**

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	17	0.03	61065	100.00
81 - 90	1320	2.16	61048	99.97
71 - 80	6759	11.07	59728	97.81
61 - 70	12140	19.88	52969	86.74
51 - 60	14454	23.67	40829	66.86
41 - 50	13289	21.76	26375	43.19
31 - 40	11753	19.25	13086	21.43
21 - 30	460	0.75	1333	2.18
11 - 20	777	1.27	873	1.43
01 - 10	95	0.16	96	0.16
00 - 00	1	0.00	1	0.00

වගුව 4

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 61065 දෙනා අතුරෙන්, 31-40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 11753කි. එය ප්‍රතිශතයක් වශයෙන් 19.25කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 13086ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 21.43කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 03 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 94%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 44 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 13%කි.


1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



උදාහරණයක් වශයෙන් ගතහොත්, පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේදී 1 වන ප්‍රශ්නය 100%ක්ම තෝරාගෙන ඇති අතර 8 වන ප්‍රශ්නය තෝරාගත් පිරිස 26%ක් පමණ වේ.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




උදාහරණයක් වශයෙන් මෙහි 01 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 16 - 20 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 18%ක් පමණ වේ.

11 -15 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 49%ක් පමණ වේ.


6 -10 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 28%ක් පමණ වේ. 0-5 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් 5% ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 **II** ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)



ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 කි. මුළු ලකුණු 100කි.

* 1 - 30 දක්වා බහුවරණ ප්‍රශ්න 30කින් ද 31 - 40 දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පිරවීමේ ප්‍රශ්න 10කින්ද, 41 - 50 දක්වා නිශ්චිත පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින්ද සමන්විතය.
* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අපේක්ෂිතය.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. පහත සඳහන් කරුණු අතුරෙන් වුවමනාවල ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
(1) අසීමිත වීම, විවිධ වීම හා පොදු වීම
(2) ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි වීම, පොදු වීම හා සීමිත වීම
(3) පුද්ගලබද්ධ වීම, සීමිත වීම හා විවිධ වීම
(4) අසීමිත වීම, විවිධ වීම හා පුද්ගලබද්ධ වීම
(5) පොදු වීම, ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි වීම හා විවිධ වීම (.........)

2. ආර්ථිකයේ විවිධ අංශවලට අයත් ව්‍යාපාර කටයුතු කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරෙන් සේවා අංශයට අයත් ව්‍යාපාර කටයුතු දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ගෘහ කර්මාන්තය හා ආනයන වෙළෙඳාම
(2) කුරුඳු ආශ්‍රිත නිමැවුම් සැකසීම හා ප්‍රවාහනය
(3) ඉදිකිරීම් හා ගෑස්
(4) ප්‍රවාහනය හා ධීවර කටයුතු
(5) සන්නිවේදනය හා ප්‍රවාහනය (.........)

3. පහත සඳහන් යුගල අතුරෙන් නොසෙවු භාණ්ඩ සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ජීවිත රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණය
(2) මෝටර් රථය හා මෝටර් රථ රක්ෂණය
(3) පුද්ගල හදිසි අනතුරු රක්ෂණය හා නිවස
(4) ප්‍රවෘත්ති පත්‍රය හා මෝටර් රථය
(5) නිවස සහ ගිනි රක්ෂණය (.........)

4. පහත වගුවේ දැක්වෙන්නේ කේවල ස්වාමි ව්‍යාපාරයක කටයුතු සඳහා බලපාන අභ්‍යන්තර බලවේග සහ ශක්තීන් කිහිපයකි.

අභ්‍යන්තර බලවේග	ශක්තීන්
A. සංවිධාන ව්‍යුහය	1. පළපුරුද්ද
B. හිමිකරු	2. යාවත්කාලීන බව
C. සේවකයින්	3. කීර්තිනාමය
D. භාවිත කරන සම්පත්	4. තීරණ ගැනීමේ පහසුව

ඉහත වගුව සැලකිල්ලට ගනිමින් අභ්‍යන්තර බලවේග හා ශක්තීන් නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 2, C - 4, D - 3
(2) A - 4, B - 2, C - 3, D - 1
(3) A - 4, B - 3, C - 1, D - 2
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 2, B - 1, C - 3, D - 4 (.........)

5. පහත වගුවේ **X** හා **Y** තීරු මගින් ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග දෙකක් ද, අවස්ථා හා තර්ජන ලැයිස්තුවක් ද පිළිවෙළින් දැක්වේ.

X	Y
A. ආදේශන භාණ්ඩ නිපදවන්නෝ B. කර්මාන්තයේ තරගකාරිත්වය	1. කර්මාන්තයේ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම 2. පාරිභෝගිකයින් භාණ්ඩ සන්නම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම 3. බුද්ධිමය දේපළ හිමිකම පිළිබඳ නීතිය ලිහිල් කිරීම 4. වෙළෙඳපොළින් ඉවත් වීමට සීමා පැවතීම

ආසන්න පරිසර බලවේග දෙකට අදාළ අවස්ථා හා තර්ජන නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරන්න.
(1) A - 2,4 / B - 1,3 (2) A - 2,3 / B - 1,4 (3) A - 1,4 / B - 2,3 (4) A - 1,2 / B - 3,4 (5) A - 3,4 / B - 1,2 (.........)

6. පහත දැක්වෙන්නේ පාරිභෝගික ආරක්ෂණයෙහි වැදගත්කම් කිහිපයකි.
A - මුදලට සරිලන වටිනාකමක් ඇති භාණ්ඩ ලබා ගැනීමට හැකි වීම
B - වෙළෙඳ විෂමාචාරවලට එරෙහි ව නීතිමය ආවරණය ලබාගත හැකි වීම
C - ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ගොඩනගා ගැනීමට හැකි වීම
D - ලාභය උපරිම කර ගැනීමට හැකි වීම
E - කීර්තිනාමය වැඩි කර ගැනීමට හැකි වීම
F - භාණ්ඩවලින් අපේක්ෂිත ප්‍රමිති හා ආරක්ෂිත අවශ්‍යතා තහවුරු කිරීමට හැකි වීම
ඉහත සඳහන් කරුණු අතුරෙන් පාරිභෝගිකයන්ට පමණක් වැදගත් වන සංයෝජනය තෝරන්න.
(1) A, B, E (2) A, B, F (3) A, C, D (4) C, D, E (5) C, D, F (.........)

7. පහත සඳහන් ආයතන අතුරෙන් පාරිභෝගික ආරක්ෂණ කටයුතුවලට සම්බන්ධ **නොවන** ආයතනය තෝරන්න.
(1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
(2) විදුලි සංදේශ නියාමන කොමිසම
(3) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
(4) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
(5) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (.........)

8. පහත සඳහන් කොන්දේසි අතුරෙන් 1890 හවුල් ආඥාපනතේ 24 වන වගන්තියට අනුව හවුල් ව්‍යාපාරයකට බල **නොපාන** කොන්දේසිය තෝරන්න.

(1) ප්‍රාග්ධනය සඳහා බැංකු පොලියට සමාන පොලියකට හිමිකමක් ඇත.
(2) ලාභාලාභ හවුල්කරුවන් අතර සමානුපාතික ව බෙදාගත යුතු ය.
(3) ඒකමතික ව නව හවුල්කරුවකු බඳවා ගත හැකි ය.
(4) හවුල්කරුවන් පෞද්ගලික ව ව්‍යාපාරය වෙනුවෙන් දැරූ වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ගෙවිය යුතු ය.
(5) සෑම හවුල්කරුවකුට ම ව්‍යාපාරයට සපයන ලද තම සේවාව වෙනුවෙන් වේතනයක් ලැබීමට හිමිකමක් නැත. (.........)

9. පහත කරුණු අතුරෙන් සීමාසහිත පොදු සමාගමක (PLC) දැකිය හැකි ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වගකීම අසීමිත වන අතර කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇත.
(2) වගකීම සීමිත වන අතර කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර නැත.
(3) අවම සාමාජික සංඛ්‍යාව එකක් වන අතර උපරිමය පනහකි.
(4) අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව එකක් වන අතර උපරිමය සීමාවක් නොමැත.
(5) වගකීම සීමිත වන අතර කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි කර ඇත. (.........)

10. පහත සඳහන් දෑ අතුරෙන්, පුද්ගලයකු සමාගමක අධ්‍යක්ෂකවරයකු ලෙස පත් **නොකිරීමට** හේතු විය හැකි කරුණ කුමක් ද?

(1) එම සමාගමේ කොටස්කරුවකු වීම
(2) ද්විත්ව පුරවැසිභාවය ලබා තිබීම
(3) බංකොලොත් නොවූ අයකු වීම
(4) වෙනත් සමාගමක අධ්‍යක්ෂකවරයකු වීම
(5) තම එකඟත්වය ප්‍රකාශ නොකිරීම (.........)

11. පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ මූලික පියවර කිහිපයකි. ඒවා අතුරෙන් කුඩා ව්‍යාපාරයක් ඇරඹීමට අදාළ ප්‍රථම පියවර වන්නේ කුමක් ද?

(1) ප්‍රාග්ධන සම්පාදනය
(2) වෙළෙඳපොළ සමීක්ෂණයක් කිරීම
(3) ව්‍යාපාර අදහසක් ඇතිකර ගැනීම
(4) ව්‍යාපාරික ස්ථානයක් සොයා ගැනීම
(5) ව්‍යාපාරය ලියාපදිංචි කිරීම (.........)

12. පහත වගුවේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයකුට බලපෑම් කරන සාධක කිහිපයක් හා උදාහරණ කිහිපයක් දැක්වේ.

සාධක	උදාහරණ
A. පුද්ගල පසුබිම් සාධක	1. ව්‍යාපාර පරපුරකින් පැවතීම
B. සමාජීය සාධක	2. ආත්ම විශ්වාසය
C. ව්‍යවසායකත්ව සාධක	3. සේවා වියුක්තිය

සාධක හා උදාහරණ නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3
(2) A - 2, B - 1, C - 3
(3) A - 1, B - 3, C - 2
(4) A - 3, B - 2, C - 1
(5) A - 2, B - 3, C - 1 (.........)

13. පහත දැක්වෙන්නේ රටවල් කිහිපයක භාවිත කරන මුදල් වර්ග ලැයිස්තුවකි.

රට	මුදල් වර්ගය
A. ඉතාලිය	1. වොන්
B. ඕස්ට්‍රේලියාව	2. ඩොලර්
C. දකුණු කොරියාව	3. රින්ගිට්
D. මැලේසියාව	4. යූරෝ

එක් එක් රටෙහි භාවිත වන මුදල් වර්ගය නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4
(2) A - 2, B - 1, C - 3, D - 4
(3) A - 3, B - 2, C - 1, D - 4
(4) A - 4, B - 2, C - 1, D - 3
(5) A - 4, B - 2, C - 3, D - 1 (.........)

14. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටුකරන කාර්ය කිහිපයකි.

A - මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම
B - රාජ්‍ය ණය කළමනාකරණය
C - විදේශ විනිමය පාලනය
D - රජයේ ආර්ථික උපදේශක වශයෙන් කටයුතු කිරීම
E - සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණය
F - ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් යනාදිය සම්බන්ධීකරණය කිරීම

ඉහත සඳහන් කාර්ය අතුරෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටු කරන නියෝජ්‍යායතන කටයුතු දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) A, B, C, D (2) A, B, D, F (3) A, B, E, F (4) B, C, D, E (5) B, C, E, F (.........)

15. පහත දැක්වෙන්නේ රක්ෂණ මූලධර්ම කිහිපයකි.

A - හානිපූරණය   B - ආදේශනය

C - දායකත්වය   D - උපරිම විශ්වාසය

ඉහත සඳහන් මූලධර්ම අතුරෙන් ජීවිත රක්ෂණයට අදාළවන මූලධර්මය කුමක් ද?

(1) A   (2) B   (3) C   (4) D   (5) කිසිවක් නොවේ. (………)

16. පහත දැක්වෙන්නේ රක්ෂණය කළ හැකි හා රක්ෂණය කළ නොහැකි අවදානම් වර්ග කිහිපයකි.

A - මෝටර් රථය දිරාපත් වීම   B - ගායකයකුගේ කටහඬ

C - මරණය   D - වයස් ගත වීම

E - සේවක ඉවත්වීම

ඉහත සඳහන් කරුණු අතුරෙන් රක්ෂණය කළ **නොහැකි** අවදානම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, B, C, D   (2) A, B, C, E   (3) A, B, D, E   (4) A, C, D, E   (5) B, C, D, E   (………)

17. පහත දැක්වෙන සාධක අතුරෙන් ආනයන අපනයන වෙළෙඳාමට බාධාවන ස්වාභාවික සාධකය කුමක් ද?

(1) ආනයන හා අපනයන සීමා කිරීම්   (2) අධික තීරුබදු

(3) සංස්කෘතිකමය වෙනස්කම්   (4) ඇඩි විනිමය ප්‍රතිපත්ති

(5) වෙළෙඳ ගිවිසුම්   (………)

18. පහත සඳහන් විද්‍යුත් වෙළෙඳාමේ වාසි අතුරෙන් ව්‍යාපාරයකට පමණක් අදාළ වන වාසිය කුමක් ද?

(1) ගනුදෙනු වේගවත් වීම   (2) වෙළෙඳපොළ කොටස පුළුල් වීම

(3) ප්‍රවාහනය පහසු වීම   (4) වෙළෙඳපොළ තොරතුරු බහුල වීම

(5) භාණ්ඩ මිල සාපේක්ෂ ව අඩු මට්ටමක පැවතීම   (………)

19. පහත සඳහන් වන්නේ සංවිධානයක විවිධ කළමනාකරණ මට්ටම්වල තනතුරු කිහිපයකි.

A - සුපරීක්ෂක   B - අලෙවි කළමනාකරු

C - මූල්‍ය කළමනාකරු   D - ප්‍රධාන විධායක නිලධාරී

E - පර්යේෂණ හා සංවර්ධන කළමනාකරු   F - සුභසාධන නිලධාරී

G - මානව සම්පත් කළමනාකරු   H - ක්‍රියාකාරී අධ්‍යක්ෂ

I - නිෂ්පාදන කළමනාකරු   J - වැඩ මූලික

මධ්‍ය කළමනාකරණයට පමණක් අයත් තනතුරු ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, C, F, G   (2) A, D, F, H, J   (3) B, C, D, E, G   (4) B, C, E, F, H   (5) B, C, E, G, I (………)

20. පහත දැක්වෙන්නේ සේවකයින් අභිප්‍රේරණය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රම කිහිපයකි.

A - නිවාස ණය   B - සේවක පුහුණුව

C - බලතල විමධ්‍යකරණය   D - සේවක රක්ෂණය

E - නිෂ්පාදන දිරි දීමනා   F - සේවය අගය කිරීමේ ලිපිය

G - දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය   H - පැමිණීමේ දිරි දීමනා

මූල්‍ය අභිප්‍රේරණ ක්‍රම ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, C, D, E   (2) A, C, D, F, G   (3) A, D, E, G, H   (4) B, C, E, G, H   (5) B, D, E, G, H (………)

21. පහත කරුණු අතුරෙන් මෙහෙයුම් කළමනාකරණයට අයත් **නොවන** කාර්යය කුමක් ද?

(1) ආපසු එවුම් බාර ගැනීම   (2) භාණ්ඩ මෝස්තරකරණය

(3) ද්‍රව්‍ය මිල දී ගැනීම   (4) තත්ත්ව පාලනය

(5) පර්යේෂණ හා සංවර්ධනය   (………)

22. නිෂ්පාදන ආයතනයකට අදාළ වියදම් කිහිපයක් පහත දැක්වේ.

A - මාසික සේවක වැටුප්   B - කම්හල් රක්ෂණ ගාස්තු

C - අමුද්‍රව්‍ය මිලට ගැනුම්   D - අලෙවි කොමිස්

E - හිස් බෝතල් මිල දී ගැනුම්   F - වරිපනම්

G - කෑලි ක්‍රමයට වැඩකරන සේවක වේතන   H - නිෂ්පාදන ඒකක මත පුරස්කාරය

විචල්‍ය වියදම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, B, C, D, E   (2) A, B, F, G, H   (3) B, E, F, G, H   (4) C, D, E, F, G   (5) C, D, E, G, H (………)

23. පහත දැ අතුරෙන් සේවා අලෙවි මිශ්‍රයට විශේෂිත වූ විචල්‍ය ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?

(1) වේටර්, ප්‍රචාරණය, දීමනා   (2) සෘජු අලෙවිකරුවන්, වට්ටම්, සන්නම්

(3) වෛද්‍යවරයා, ස්වයංක්‍රීය සේවා ක්‍රියාවලිය, වයිෆයි   (4) සුපරීක්ෂක, තොග, ගුණත්වය

(5) ප්‍රවාහනය, ඇසුරුම්, වයිෆයි   (………)

24. පහත දැක්වෙන අලෙවිකරණයේ ප්‍රතිඵල අතුරෙන් පාරිභෝගිකයාට පමණක් වැදගත්වන කාණ්ඩය තෝරන්න.

A - අයිතිකරුවන්ගේ හා සේවකයින්ගේ තෘප්තිය වර්ධනය වීම
B - භාණ්ඩ හා සේවා පරාසය පුළුල් වීම
C - වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම
D - ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු වීම
E - වෙළෙඳපොළ පිළිබඳ දැනුම පුළුල් වීම
F - පහසුවෙන් භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි වීම

(1) A, B, D (2) B, E, F (3) C, D, F (4) C, E, F (5) D, E, F (………)

25. පහත දෑ අතුරෙන් සේව්‍ය අයිතිවාසිකමක් ලෙස දැක්විය හැක්කේ කුමක් ද?

(1) සංවිධානයේ අරමුණු ඉටුකර ගැනීමට වැඩ කිරීම
(2) වැඩ ස්ථානයේ යහපත් ලෙස හැසිරීම
(3) සේවා ගිවිසුම අනුව කාර්ය ඉටු කරවා ගැනීම
(4) වැටුපට සරිලන සේවාවක් ලබා දීම
(5) සේවා ගිවිසුමට අනුව කාර්ය ඉටු කිරීම (………)

26. ස්ථිර සේවයට බඳවාගත් සේවකයකු ඔහුගේ/ඇයගේ තනතුරෙහි තහවුරු කිරීමට පෙර හඳුන්වනු ලබන්නේ,

(1) අනියම් සේවකයකු ලෙස ය.
(2) තාවකාලික සේවකයකු ලෙස ය.
(3) ආදේශක සේවකයකු ලෙස ය.
(4) පරිවාස සේවකයකු ලෙස ය.
(5) කොන්ත්‍රාත් සේවකයකු ලෙස ය. (………)

27. පහත සඳහන් වන්නේ ආයතනයක භාවිත කරන පරිගණකගත කළ විවිධ කළමනාකරණ තොරතුරු උප-පද්ධති කිහිපයකි.

A - ගැනුම් සැලසුම් කිරීම හා පාලනය
B - ක්‍රියාවලි හා යන්ත්‍රෝපකරණ පාලනය
C - ගිණුම්කරණ පද්ධතිය
D - සේවක වැටුප් පද්ධතිය
E - පරිගණක ආධාර නිර්මාණය
F - සේවක පැමිණීම

මෙහෙයුම් තොරතුරු පද්ධතියට පමණක් අදාළ උප-පද්ධති ඇතුළත් කාණ්ඩය තෝරන්න,

(1) A, B, C (2) A, B, E (3) A, D, F (4) B, C, F (5) D, E, F (………)

28. කේවල ස්වාමි ව්‍යාපාරයක සාර්ථකත්වය මැනීම සඳහා භාවිත කළ **නොහැකි** මිනුම් දණ්ඩක් වන්නේ,

(1) නිෂ්පාදනයේ හෝ සේවාවේ ගුණත්වය වේ.
(2) මූල්‍ය කාර්යසාධනය වේ.
(3) අයිතිකරුගේ අධ්‍යාපන මට්ටම වේ.
(4) අයිතිකරුගේ ව්‍යවසායකත්ව කුසලතා වේ.
(5) සේවක සංඛ්‍යාව වේ. (………)

29. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ලේඛනයක අඩංගු **නොවන** අයිතමයක් වන්නේ,

(1) ඉඩම් හා ගොඩනැගිලි සඳහා දරනු ලබන පිරිවැය වේ.
(2) ව්‍යාපාර ආරම්භ කිරීමේ පිරිවැය වේ.
(3) කීර්තිනාමය වේ.
(4) ණය වාරික ගෙවීම් වේ.
(5) පරිපාලන වියදම් වේ. (………)

30. පහත සඳහන් දෑ අතුරෙන් මූල්‍ය සැලැස්මක ඇතුළත් **නොවන්නේ**,

(1) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශයයි.
(2) ණය ආපසු ගෙවීමේ සටහනයි.
(3) ප්‍රාග්ධන අවශ්‍යතායි.
(4) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයයි.
(5) සේවක අනුප්‍රාප්තික සැලැස්මයි. (………)


2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	4	16.	4
02.	5	17.	3
03.	1	18.	2
04.	3	19.	5
05.	2	20.	3
06.	2	21.	1
07.	3	22.	5
08.	1	23.	3
09.	5	24.	4
10.	5	25.	3
11.	3	26.	4
12.	3	27.	2
13.	4	28.	3
14.	5	29.	3
15.	4	30.	5

වගුව 06

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **60**කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ :



ප්‍රස්තාරය 05

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය					
		1	2	3	4	5	Missing
1	4	3%	0%	1%	94%	2%	-
2	5	1%	1%	1%	1%	96%	-
3	1	68%	3%	6%	15%	8%	-
4	3	0%	1%	95%	3%	1%	-
5	2	21%	45%	11%	12%	12%	-
6	2	1%	96%	2%	0%	0%	-
7	3	1%	52%	45%	1%	0%	-
8	1	63%	1%	20%	6%	9%	-
9	5	7%	10%	4%	28%	51%	-
10	5	7%	10%	4%	28%	51%	-
11	3	10%	17%	68%	4%	1%	-
12	3	2%	13%	57%	2%	27%	-
13	4	4%	3%	7%	61%	24%	-
14	5	15%	11%	10%	21%	43%	-
15	4	9%	3%	3%	75%	10%	-
16	4	12%	4%	46%	26%	12%	-
17	3	2%	6%	88%	2%	2%	-
18	2	18%	75%	3%	3%	1%	-
19	5	3%	8%	5%	4%	79%	-
20	3	2%	3%	88%	2%	6%	-
21	1	48%	22%	5%	6%	18%	-
22	5	4%	5%	7%	11%	74%	-
23	3	7%	17%	58%	5%	12%	1%
24	4	0%	11%	12%	68%	8%	-
25	3	10%	2%	73%	7%	7%	-
26	4	6%	11%	2%	80%	1%	-
27	2	13%	52%	21%	7%	6%	-
28	3	2%	5%	39%	5%	49%	-
29	3	2%	4%	81%	9%	3%	-
30	5	1%	3%	4%	1%	90%	-

වගුව 06

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.
* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය යි.
*
* I පත්‍රයේ ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා පිළිතුරු සැපයීමේ දී,

  උදා:- 2 වන සහ 6 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 96%ක් නිවැරදි ප්‍රතිචාර දක්වා තිබේ. අයදුම්කරුවන්ගෙන් අඩුම ප්‍රතිශතයක් එනම් 26%ක නිවැරදි ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශ්නය 16 වන ප්‍රශ්නයයි.

2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා :

පළමු ප්‍රශ්න 30 සැලකූ විට ප්‍රශ්න අංක 05, 07, 14, 16, 21 සහ 28 යන ප්‍රශ්නවල පහසුතාව 50% කට වඩා අඩුය. එම ප්‍රශ්නවලට අදාළ ඒකක හා එක් එක් ප්‍රශ්නවල පහසුතාව පහත දැක්වේ.

පාඩම් ඒකක	ප්‍රශ්න අංක	පහසුතාව
ව්‍යාපාර පරිසරය	05	45%
රජය හා ව්‍යාපාර	07	45%
මුදල් හා බැංකු	14	43%
රක්ෂණය	16	26%
මෙහෙයුම් කළමනාරණය	21	48%
මූල්‍ය කළමනාකරණය	28	39%

- ප්‍රශ්න අංක 05 (ඒකකය - ව්‍යාපාර පරිසරය)
  නිවැරදි පිළිතුර 2 වන වරණය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 45%ක් පමණි. ඒ අනුව අයදුම්කරුවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් වැරදි පිළිතුරු තෝරා ගැනීමට හේතුව වනුයේ ආසන්න පරිසර බලවේගවලට අදාළ අවස්ථා හා තර්ජන පිළිබඳව සිසුන් නිවැරදිව හඳුනා ගෙන නොමැති වීමය. ව්‍යාපාර ආයතනයකට අදාළ විවිධ බලවේගයන් හඳුනා ගැනිම සහ ඒවායේ හැසිරීම. ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන වන ආකාර සිසුන්ට න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීමට මඟපෙන්වීමක් අවශ්‍ය ය. මෙවැනි සම්බන්ධතාවයන් ගැලපීමට ඇති ප්‍රශ්නවලදී සිසුන් විෂයය දැනුම මෙන්ම තාර්කික බුද්ධිය මෙහෙයවීමට ද හුරු පුරුදු කළ යුතුය.

- ප්‍රශ්න අංක 07 (ඒකකය - රජය හා ව්‍යාපාර)
  නිවැරදි පිළිතුර 3 වරණය වන අතර එය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 45% පමණි. එහෙත් දෙවන වරණය වන විදුලි සංදේශ නියාමන කොමිසම පාරිභෝගික ආරක්ෂණ කටයුතුවලට අදාළ නොවන පිළිතුරක් ලෙස සිසුන් තෝරාගෙන තිබීම ප්‍රධාන ගැටලුව වේ. කාලීනව පාරිභෝගික ආරක්ෂණයට අදාළ ආයතන හා සංවිධාන පිළිබඳව නිරවුල් අවබෝධයක් සිසුන් තුළ ප්‍රගුණ කළ යුතුය. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර හා වාණිජ කටයුතුවලට සම්බන්ධ රාජ්‍ය ආයතනයන්හි කාර්යභාරය හා කාලීන වෙනස්කම් පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුය.

- ප්‍රශ්න අංක 14 (ඒකකය - මුදල් හා බැංකු) නිවැරදි පිළිතුර වූ 5 වන වරණය තෝරාගෙන ඇත්තේ 43%කි. මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් හා නියෝජ්‍යායතන කටයුතු නිවැරදිව වෙන් කර හඳුනා ගැනීමට අයදුම්කරුවන් අපොහොසත් වී ඇත. එහෙයින් නියෝජ්‍යායතන කටයුතු මොනවාදැයි වෙන්කර පැහැදිලිව දැනුවත් කිරීමක් සිසුන්ට ලබා දිය යුතුය.

- ප්‍රශ්න අංක 16 (ඒකකය - රක්ෂණය)
  නිවැරදි වරණය වූ 4 වන වරණය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 26%ක් පමණි. මෙම ප්‍රශ්නය නිවැරදිව වටහාගෙන නොමැති වීම නිසා අයදුම්කරුවන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් එනම් 46%ක් තෝරා ගෙන ඇත්තේ 3 වන වරණයයි. එයට හේතුව "මරණය" රක්ෂණය කළ හැකි අවදානමක් ලෙස අයදුම්කරුවන් විසින් සැලකීම විය හැකිය. රක්ෂණ අවදානම් පිළිබඳ මූලික අවබෝධයත්, රක්ෂණය කළ හැකි හා රක්ෂණය කළ නොහැකි අවදානම් වෙන් කර ගැනීමේදී නිවැරදි පදනම පිළිබඳ නිරවුල් අවබෝධයත් සිසුන්ට ප්‍රගුණ කිරීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් විය යුතුය. රක්ෂණය කළ හැකි හා නොහැකි අවදානම් ප්‍රායෝගික නිදසුන් කෙරෙහි අවධාරණය කළ යුතුය.

- ප්‍රශ්න අංක 21 (ඒකකය - මෙහෙයුම් කළමනාකරණය)
  ප්‍රශ්න අංක 21 සඳහා නිවැරදි පිළිතුර 1 වන වරණය වන අතර එය තෝරාගෙන ඇති ප්‍රතිශතය 48% කි. මෙහෙයුම් කළමනාකරණයට අයත් ශ්‍රිතයන්/ කාර්යයන් නිවැරදිව අවබෝධ කර නොගැනීම නිසා 2 වන හා 5 වන වරණයන්ට පිළිවෙළින් 22% හා 18% වශයෙන් අයදුම්කරුවන් තෝරාගෙන තිබුණි. මෙහෙයුම් කළමනාකරණ ශ්‍රිතයන් පිළිබඳව නිවැරදි අවබෝධයක් සිසුන්ට ලබාදීම තුළින් මේ තත්ත්වය මඟ හරවා ගත හැක.

- ප්‍රශ්න අංක 28 (ඒකකය - මූල්‍ය කළමනාකරණය)
  නිවැරදි පිළිතුර 3 වන වරණය තෝරාගත් ප්‍රතිශතය 39%කි. අයදුම්කරුවන්ගෙන් 49%ක් 5 වරණය තෝරාගෙන තිබුණි. මෙයට හේතුව වී ඇත්තේ ව්‍යාපාර සංවිධානවල සාර්ථකත්වය මැනීම සඳහා භාවිත කරන මිනුම් දඬු කෙරෙහි නිශ්චිත අවබෝධයක් නොතිබීමයි. සාර්ථකත්වය මැනීම සඳහා භාවිත කළ හැකි ප්‍රමාණාත්මක හා ගුණාත්මක මිණුම් දඬු හා සාධක පිළිබඳව වැඩි දැනුමක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සංවිධානය කිරීම ඉතා වැදගත් වේ.

2.1.7 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

31. (අ) විවිධ පාර්ශ්වයන් අතුරෙන් ව්‍යාපාර තම පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා................................ පිළිබඳ සැලකිලිමත් වන අතර, යටිතල පහසුකම් ලබා ගැනීම සඳහා .... පිළිබඳ සැලකිලිමත් වේ.

(ආ) ව්‍යාපාරයක හර පද්ධතිය .... පරිසර සාධකයක් වන අතර, තාක්ෂණය .... පරිසර සාධකයකි.

පිළිතුරු

(අ) අයිතිකරුවන්, රජය, ගණුදෙනුකරු **(ලකුණු 0.5යි)**

(ආ) අභ්‍යන්තර, සාර්ව (පිළිවෙළින්) **(ලකුණු 0.5යි)**

32. (අ) බදු ආදායම .... යටතේ ද, වර්තන වියදම .... යටතේ ද වර්ග කළ හැකි ය.

(ආ) වාණිජ බැංකු හා ප්‍රාථමික අලෙවිකරුවන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේ දී අය කරනු ලබන පොලී අනුපාතය .... ලෙසත්, මහ බැංකුව විසින් තෝරා ගත් ක්ෂේත්‍ර සඳහා ලබා දෙන ණය සීමා පැනවීම .... ලෙසත් හඳුන්වනු ලැබේ.

පිළිතුරු

(අ) රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම **(ලකුණු 0.5යි)**

(ආ) ප්‍රති විකුණුම්, ගුණාත්මක ණය පාලනය **(ලකුණු 0.5යි)**
(නිත්‍ය ණය පහසුකම් අනුපාතය)

33. හවුල් ව්‍යාපාරයක හා සීමාසහිත පෞද්ගලික සමාගමක මූලික ලක්ෂණ පදනම් කරගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

නිර්ණායක	හවුල් ව්‍යාපාරය	සීමාසහිත පෞද්ගලික සමාගම (Pvt)
1. සාමාජික සංඛ්‍යාව	2 - 20	....
2. වගකීම	....	සීමිතයි
3.	එකඟ වූ පරිදි	කොටස්
4. කළමනාකරණය	හවුල්කරුවන්	....

පිළිතුරු

(1) 1 - 50 **(ලකුණු 0.5යි)**

(2) අසීමිතය **(ලකුණු 0.5යි)**

(3) ප්‍රාග්ධනය **(ලකුණු 0.5යි)**

(4) අධ්‍යක්ෂ මණ්ඩලය **(ලකුණු 0.5යි)**

34. (අ) සමාගමක කොටස්කරුවකු වීම සඳහා අනිවාර්යයෙන් ම සපුරාලිය යුතු කොන්දේසි **දෙක** වන්නේ .... හා .... ය.

(ආ) ශ්‍රී ලංකාවේ වරලත් ව්‍යාපාර සඳහා උදාහරණ **දෙකක්** වන්නේ .... හා .... ය.

පිළිතුරු

(අ) කොටස් මිලට ගැනීම, කොටස් නාම ලේඛනයට නම ඇතුළත් වීම **(ලකුණු 0.5යි)**

(ආ) KFC, Mc Donald, Pizzahut, කොකාකෝලා, සිපෙට්කෝ, ඩොමිනෝස් **(ලකුණු 0.5යි)**
Burger Kings, Perera and Sons, Keels Super

35. ආයතනයක හදිසි පිටවීමේ දොරටුව (Emergency Exit) පෙන්වන ඊතලය සහිත පුවරුව .... හා .... සන්නිවේදන ක්‍රමයක් වශයෙන් සැලකිය හැකි අතර, ආයතනය විසින් පාරිභෝගිකයකුට යවන ලද ලිපිය .... හා .... සන්නිවේදන ක්‍රමයකි.

පිළිතුරු

(අ) සංඥා සංකේත, අභ්‍යන්තර **(ලකුණු 0.5යි)**

(ආ) ලිඛිත, බාහිර **(ලකුණු 0.5යි)**

36. (අ) අපනයනය කිරීමේ දී එම භාණ්ඩ අපනයනය කළ රටේ නිපදවා ඇති බවට පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ලියවිල්ල .... වේ.

(ආ) ආනයනය කළ භාණ්ඩ ආනයනය කළ රට තුළ දී රේගු අධීක්ෂණය යටතේ අගයන් එකතු කිරීමෙන් පසුව අපනයනය කිරීම .... වේ.

පිළිතුරු

(අ) ප්‍රභවස්ථාන සහතිකය (මුල්තැන් සහතිකය / නිපන් සහතිකය) **(ලකුණු 0.5යි)**

(ආ) අන්තරාළ වෙළෙඳාම **(ලකුණු 0.5යි)**

37. (අ) සේවකයින් .... තම දායකත්වය ලබාදීම අභිප්‍රේරණයේ ප්‍රධාන ලක්ෂණය වේ.

(ආ) ආයතනයක භාවිත කරනු ලබන කළමනාකරණ පාලන විධි **දෙකක්** ලෙස .... හා .... දැක්විය හැකි ය.

පිළිතුරු

(අ) ස්වකැමැත්තෙන් **(ලකුණු 0.5යි)**

(ආ) ඉදිරි පෝෂණ, සහගාමී, පසු පෝෂණ **(ලකුණු 0.5යි)**

38. නිෂ්පාදන ක්‍රම වර්ගීකරණය සැලකිල්ලට ගනිමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

නිර්ණායක	**කාර්ය නිෂ්පාදන**	**ප්‍රවාහ නිෂ්පාදන**
1. නිමැවුම් පරිමාණය	....	....
2.	....	එක් නිෂ්පාදනයක් පමණයි

පිළිතුරු

(අ) ඉතා පහළය, ඉතා විශාලය **(ලකුණු 0.5යි)**

(ආ) නිෂ්පාදිතය, විවිධය **(ලකුණු 0.5යි)**

39. (අ) නිෂ්පාදන ක්‍රියාවලියේ එක් අදියරක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු දෑ එක් ස්ථානයකින් කළ හැකි ආකාරයට බිම් සැලැස්ම/පිරියත (Lay out) නිර්මාණය කිරීම .... වන අතර, සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යන් අඛණ්ඩ ව ගලා යන ආකාරයට බිම් සැලැස්ම/පිරියත නිර්මාණය කිරීම .... වේ.

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණයේ දී (EOQ) .... පිරිවැය හා .... පිරිවැය එකිනෙකට සමාන වේ.

පිළිතුරු

(අ) ක්‍රියාවලි පිරියත, නිෂ්පාදිත පිරියත **(ලකුණු 0.5යි)**

(ආ) තොග පවත්වාගෙන යාමේ පිරිවැය, ඇණවුම් කිරීමේ පිරිවැය (අත්පත්) **(ලකුණු 0.5යි)**

40. (අ) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වර්තමානයේ භාවිතවන මිල දර්ශක **දෙක** වනුයේ .... හා ....ය.

(ආ) විදේශිකයින් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ගනුදෙනුවලට සම්බන්ධ වන්නේ .... ගිණුම් හරහා වන අතර මෙම ගිණුම් පවත්වාගෙන යන බැංකු .... නමින් හැඳින්වේ.

පිළිතුරු

(අ) සියලු කොටස් මිල දර්ශකය (ASPI), S & P Sri Lanka 20 **(ලකුණු 0.5යි)**
(ආ) සියාරා (SIERA), භාරකාර බැංකු **(ලකුණු 0.5යි)**

41. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කරන ආකාර **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- පොලී අනුපාතිකය **(ලකුණු 0.5යි)**
- ණයවර ලිපි කාසි ආන්තික පැනවීම **(ලකුණු 0.5යි)**
- සංචිත අවශ්‍යතා වෙනස් කිරීම **(ලකුණු 0.5යි)**
- විවෘත වෙළෙඳපොළ කටයුතු **(ලකුණු 0.5යි)**
- වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම **(ලකුණු 0.5යි)**
- ණය සීමාව පැනවීම **(ලකුණු 0.5යි)**
- යහපෙළඹීම/ ශිෂ්ඨ ප්‍රයෝග **(ලකුණු 0.5යි)**

42. විසිතුරු මල් වගා කිරීමේ ව්‍යාපාරයක් සඳහා ඔබට රජයෙන් ලබාගත හැකි සේවා **දෙකක්** හා ඒවා ලබාගත හැකි ආයතන **දෙකක** නම් පහත වගුවේ ලියන්න.

සේවා	ආයතන
1.	....
2.	....

සේවා	ආයතන
උපදේශක	කාර්මික සංවර්ධන මණ්ඩලය/ අපනයන සංවර්ධන මණ්ඩලය/ උද්භිත උද්‍යානය/ කෘෂි කර්ම දෙපාර්තමේන්තුව
තාක්ෂණික	කාර්මික සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය
යටිතල පහසුකම්	කාර්මික සංවර්ධන මණ්ඩලය
අලෙවි පහසුකම්	අපනයන සංවර්ධන මණ්ඩලය, වාණිජ දෙපාර්තමේන්තුව, වෙළෙඳ මණ්ඩල
මූල්‍ය	රාජ්‍ය බැංකු/ ග්‍රාමීය බැංකු/ දිවිනැගුම

43. සුළු ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා රජයෙන් හෝ වෙනත් ආයතනවලින් ලබාදෙන සේවා වර්ග **හතරක්** ලියන්න.

1. .... 2. ....

3. .... 4. ....

පිළිතුරු

- මූල්‍ය සේවා **(ලකුණු 0.5යි)**
- තාක්ෂණික සේවා **(ලකුණු 0.5යි)**
- උපදේශන සේවා **(ලකුණු 0.5යි)**
- යටිතල පහසුකම් **(ලකුණු 0.5යි)**
- නීතිමය සේවා **(ලකුණු 0.5යි)**
- අලෙවි සේවා **(ලකුණු 0.5යි)**

44. නියෝජිත කාර්යය අනුව එක් එක් නියෝජිතයා නම් කර, ඔවුන් විසින් ලබාගන්නා නියෝජිත ගාස්තු පහත සඳහන් වගුවෙහි දක්වන්න.

කාර්යය	**නියෝජිතයා**	**නියෝජිත ගාස්තුව**
1. ප්‍රධානියා වෙනුවෙන් ඔහුගේ ණයට විකුණුම්වල ණය මුදල් එකතු කිරීම	....	....
2. ප්‍රධානියා වෙනුවෙන් විවෘත ව හා වාචික ව ඉහළ මිල ගණන් සඳහා අලෙවි කටයුතු සම්බන්ධීකරණය කිරීම	....	....

පිළිතුරු

(1) කැපකරු නියෝජිතයා, කැපකරු කොමිස් **(ලකුණු 0.5යි)**

(2) වෙන්දේසිකරු, වෙන්දේසි ගාස්තුව **(ලකුණු 0.5යි)**

45. ජාත්‍යන්තර වෙළෙඳාමේ දී භාවිත වන පහත සඳහන් කෙටි යෙදුම්වල පූර්ණ නාමය ඒ ඉදිරියෙන් ලියන්න.

1. CIF : ....
2. FOB : ....
3. L / C : ....
4. B / L : ....

පිළිතුරු

(1) Cost, Insurance, Fright මිල, රක්ෂණ, ගැල් කුලිය/ නැව් කුලිය **(ලකුණු 0.5යි)**

(2) Free on Board නැව තෙක් නොමිලේ **(ලකුණු 0.5යි)**

(1) Letter of Credit ණයවර ලිපිය **(ලකුණු 0.5යි)**

(2) Bill of Lading නෞභාරපත **(ලකුණු 0.5යි)**

46. (අ) ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන **දෙකක්** ලියන්න.

1. .... 2. ....

(ආ) විද්‍යුත් මුදල් පසුම්බියක් (e-wallet) භාවිත කිරීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

1. ....
2. ....

පිළිතුරු

(අ)
- රක්ෂණ සමාගම් **(ලකුණු 0.5යි)**
- සේවක අර්ථ සාධක අරමුදල **(ලකුණු 0.5යි)**

- සේවක භාරකාර අරමුදල (ලකුණු 0.5යි)
- අනෙකුත් අර්ථ සාධක අරමුදල් (ලකුණු 0.5යි)
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල (ලකුණු 0.5යි)

(ආ) පහසුව, ආරක්ෂාව, ජාත්‍යන්තර ගණුදෙනුවලදී භාවිත කළ හැකි වීම, කාර්යක්ෂමතාව පැය 24 පුරා සේවා ලැබීම (ලකුණු 0.5යි)

47. වෘත්තීය සමිතියක් ඇති කරගැනීමේ ප්‍රධාන අරමුණු **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- සාධාරණ වැටුපක් හා යහපත් වැඩ පරිසරයක් ලබා ගැනීම
- වැඩ කරන කාලය පිළිබඳ ගැටළු විසඳා ගැනීම
- වෘත්තීය සෞඛ්‍ය හා වෘත්තීය අනතුරුවලින් ආරක්ෂාව සලසා ගැනීම
- ආයතනයේ කළමනාකරණ තීරණවලට සහභාගීවීම
- රැකියා සුරක්ෂිතතාව ඇති කර ගැනීම
- අධ්‍යාපනය හා පුහුණුව ලබා ගැනීම
- අසනීප හෝ විශ්‍රාමික හෝ වැඩ වර්ජිත සේවකයන්ට සහන සලසා ගැනීම
- සාමූහික කේවල් කිරීම (ලකුණු 0.5 × 4) (ලකුණු 02)

48. තොරතුරු වර්ගීකරණයේ නිර්ණායක **හතරක්** ලියන්න.

1. .... 2. ....
3. .... 4. ....

පිළිතුරු

- මූලාශ්‍රය අනුව
- කළමනාකරණ මට්ටම අනුව
- සම්භාවිතාව අනුව
- සමූහගතවීම හා වෙන් කිරීම අනුව
- ස්වභාවය අනුව
- කාලය අනුව
- නිෂ්පාදන ශ්‍රිතය අනුව

(ලකුණු 0.5 × 4) (ලකුණු 02)

49. සංවිධාන සටහනකින් පෙන්නුම් කළ හැකි සංවිධාන ව්‍යුහයක ලක්ෂණ **හතරක්** ලියන්න.

1. ....
2. ....
3. ....
4. ....

පිළිතුරු

- මධ්‍යගත වීම හෝ විමධ්‍යගත වීම
- අණකිරීමේ ඒකීයතාව
- අධිකාරි බල මට්ටම්
- සම්බන්ධතා රටාව
- දෙපාර්තමේන්තුකරණය/ වැඩ බෙදීම
- පාලන අවකාශය
- තොරතුරු ගලා යෑම

(ලකුණු 0.5 × 4) (ලකුණු 02)

50. භාණ්ඩ ඇසුරුම්වල සඳහන්, පොදුවේ භාවිත කරන සංකේත කිහිපයක් පහත දැක්වේ. එම සංකේතවලින් අදහස් කරන්නේ කුමක් දැ'යි සඳහන් කරන්න.

1.  ....

2.  ....

3.  ....


4.  ....

පිළිතුරු

- උඩු අතට Keep up
- ප්‍රවේශමෙන් පරිහරණය කරන්න Handle with care
- ප්‍රතිචක්‍රීයකරණය Recycle
- බිඳෙන සුළුය Fragile

(ලකුණු 0.5 × 4) (ලකුණු 02)

2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ



ප්‍රස්තාරය 06

2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය

ප්‍රශ්න අංකය	ලකුණු ලබාගත් ප්‍රතිශතය			
	ලකුණු 0	ලකුණු 1	ලකුණු 2	ප්‍රතිචාර නොදැක්වූ
31	9%	53%	37%	1%
32	32%	41%	24%	2%
33	7%	37%	55%	0%
34	19%	51%	28%	2%
35	28%	43%	27%	2%
36	41%	37%	18%	3%
37	65%	26%	5%	4%
38	31%	39%	26%	4%
39	38%	35%	23%	4%
40	53%	33%	10%	3%
41	23%	29%	45%	2%
42	24%	43%	31%	2%
43	14%	42%	43%	1%
44	55%	30%	9%	6%
45	71%	11%	1%	16%
46	7%	64%	29%	1%
47	20%	52%	26%	2%
48	47%	23%	26%	5%
49	46%	26%	24%	5%
50	14%	54%	30%	2%

වගුව 07

* I පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් (2 × 20) මුළු ලකුණු සංඛ්‍යාව 40 ක් වේ. ඒ අනුව ප්‍රශ්න අංක 37, 40, 44 හා 45 යන ප්‍රශ්න සඳහා ලකුණු 0 ලබාගත් ප්‍රතිශතය 50% ඉක්මවා ඇත. එසේම ප්‍රශ්න අංක 45 ට ප්‍රතිචාර නොදැක් වූ ප්‍රතිශතය 16% කි.

2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා ඃ

32 වන ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේදී සිසුන් තුළ ශ්‍රී ලංකා මහබැංකුව විසින් පනවන ගුණාත්මක ණය සීමාවන් සහ ප්‍රමාණාත්මක ණය සීමාවන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැති බව පෙනේ. ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල ඇති සෘජු බලපෑම කෙරෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී වැඩි අවධානයක් යොමු කළ යුතුය.

36 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී ප්‍රති අපනයනය හා අන්තරාල වෙළෙඳාම යන සංකල්පයන් ක්‍රියාත්මක කිරීමට අදාළව සිසුන්ට නිරවුල් අවබෝධයක් නොමැති වූ බව පෙනේ. මෙහිදී විශේෂයෙන් තේරුම් ගත යුත්තේ අන්තරාල වෙළෙඳාම සිදුවීමේදී රේගු අධීක්ෂණය සිදු කිරීම ප්‍රතිඅපනයනයෙන් වෙනස්වන බව සිසුන් තුළ තහවුරු විය යුතුය.

37 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් කළමනාකරණය ආශ්‍රයෙන් මෙම ප්‍රශ්නය විමසා ඇත. සිසුන් තුළ කළමනාකරණ මූලිකාංග වන මෙහෙයවීම හා පාලනය පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීමයි. කළමනාකරණ පිළිබඳ න්‍යායාත්මක දැනුම පුළුල් කර ගැනීම සඳහා මඟ පෙන්වීමක් ලබා දිය යුතුයි. තවද අභිප්‍රේරණයේදී සේවකයින් ස්ව කැමැත්තෙන් සේවයේ යෙදෙන බව සිසුන් තුළ තහවුරු විය යුතුය. ඒ සඳහා අභිප්‍රේරණය යනු කුමක්දැයි පැහැදිලිව නිර්වචනය කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දිය යුතුය.

40 වන ප්‍රශ්නය කොළඹ කොටස් වෙළෙඳපොල ආශ්‍රයෙන් විමසා ඇති ප්‍රශ්නයකි. කාලීන තොරතුරු පිළිබඳව දැනුවත් නොවීම නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම දුර්වල වී ඇත. කොළඹ කොටස් වෙළෙඳපොල පිළිබඳ කාලීන ප්‍රවණතාවන් සිසුන් දැනුවත් කළ යුතුයි. වර්තමානයේ පවත්නා දියුණු සන්නිවේදන මාධ්‍යයන් තුළින් මේ පිළිබඳ දැනුම දියුණු කර ගත හැකිය.

කොළඹ කොටස් වෙළෙඳපොල පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමේ වැඩ පිළිවෙළක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සංවිධානය කිරීම ඉතා වැදගත් වේ.

44 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 55% ක්ම ලකුණු ලබා නොමැත. මෙහි දී බෙදා හැරීමේ ක්‍රියාවලියට දායක වන අතරමැදියන් අතුරෙන් නියෝජිතයන් හා වෙන්දේසිකරුවන් පිළිබඳව ඔවුන්ගේ කාර්යය සහ අදාළ ප්‍රතිලාභ නිශ්චිත ආකෘතියකට ඉදිරිපත් කිරීමට සිසුන් අපොහොසත් වී ඇත. නියෝජිත කාර්ය හා වෙන්දේසි ක්‍රියාවලියන්ට අදාළව ප්‍රායෝගික අවබෝධය සිසුන්ට ලබාදිය යුතුය.

45 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 71% ක්ම ලකුණු ලබා ගෙන නොමැත. මෙම කොටසේ ලකුණු 0 (බිංදුව) ලබාගත් ඉහළම ප්‍රතිශතය මෙය වේ. තවද ලකුණු 01 (එක) ලබාගත් ප්‍රතිශතය 11%කි. මෙම කොටසේ අවම ප්‍රතිශතය ද, ලකුණු 02 (දෙක) ලබාගත් 1% ප්‍රතිශතය මෙම කොටසේ අවම ප්‍රතිශතය ද වේ. මීට හේතුව ජාත්‍යන්තර වෙළෙඳාමේදී භාවිත වන කෙටි යෙදුම් පිළිබඳ ප්‍රායෝගික දැනුවත්භාවය ඉතාම දුර්වල මට්ටමක පැවතීමයි. ව්‍යාපාර අධ්‍යයනය ගෝලීය විෂයයක් වන බැවින් ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ අධ්‍යයනයේදී එහි භාවිත වන කෙටි යෙදුම් පිළිබඳව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධාරණය කරවීම ඉතා වැදගත් වේ.

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03 කි. මුළු ලකුණු 100 කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

I **කොටස** - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

II **කොටස** - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය.

* එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

* ප්‍රශ්න පත්‍ර දෙක සඳහා අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය සඳහා ලකුණු	=	100
II පත්‍රය සඳහා ලකුණු	=	100
අවසාන ලකුණු	=	200 ÷ 2
	=	100

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1 හා 4.2 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

II පත්‍රය

1 ප්‍රශ්නය

I කොටස

1. (i) ව්‍යාපාර ආයතන සමාජ සංවිධාන පද්ධතියේ කොටසකි.

(අ) සෑම සංවිධානයකට ම පොදු වූ ලක්ෂණ ඇත. විධිමත් ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

(ආ) “සමාජයේ පැවැත්මට ව්‍යාපාර අත්‍යවශ්‍ය වේ.” ව්‍යාපාර නිර්වචනය කරමින් මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) ව්‍යාපාරයක සාර්ථක හෝ අසාර්ථක බවට එහි අභ්‍යන්තර හා බාහිර පරිසරයන් බලපානු ලැබේ.

(අ) ව්‍යාපාරයකට බලපාන අභ්‍යන්තර පරිසර සාධක **දෙකක්** නම් කර, ඒවා ව්‍යාපාරයේ සාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරයකට බලපාන සාර්ව පරිසර සාධක **දෙකක්** නම් කර, ඒවා ව්‍යාපාරයේ අසාර්ථකත්වය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශය තුළ සේවා සපයන ආයතන බහුල ව දක්නට ලැබේ.

(අ) ව්‍යාපාර උපකාරක සේවා **හතරක්** සඳහන් කරන්න.

(ආ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන සේවා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) වර්තමානයේ ව්‍යාපාර බොහොමයක් සමාජ වගකීම් ඉටු කිරීම සඳහා විශාල මුදලක් වැය කරනු ලැබේ.

(අ) සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** ලියන්න.

(ආ) ව්‍යාපාරික ආචාරධර්ම පද්ධතියක් සැකසීමේ දී සැලකිලිමත් විය යුතු සාධක **දෙකක්** උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) යෝගට්වල ගුණත්වය පිළිබඳ ව පාරිභෝගිකයින්ගෙන් පැමිණිලි රාශියක් ලැබූ පසු යෝගට් නිෂ්පාදනාගාරයක හිමිකරුවකු වන සමන්ත විසින් තත්ත්වයෙන් ඉතා හොඳ අමුද්‍රව්‍ය භාවිත කර ගුණත්වය ඉහළ නැංවීමට තීරණය කරන ලදී. සමන්තගේ මෙම තීරණය භාණ්ඩයේ ගුණත්වය ඉහළ දැමීමට ඉවහල් වන්නේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

1. (i) (අ) (i) පොදු අරමුණක් තිබීම

(ii) සංවිධාන ව්‍යුහයක් පැවතීම

(iii) පුද්ගලයන් සිටීම

(iv) සම්පත් පැවතීම

(v) කාර්යයන් රාශියක් තිබීම

(vi) ව්‍යාපාර නාමයක් පැවතීම

(vii) පිළිගත් සම්බන්ධතා රටාවක් තිබීම

(viii) නීත්‍යානුකූලබවක් පැවතීම (කරුණු 04 ට ලකුණු 02)

(ආ) විවිධ මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා වන ඕනෑම ආර්ථික කටයුත්තක් ව්‍යාපාරයක් වේ. (නිර්වචනයට ලකුණු 01)

සංකීර්ණ වූ අවශ්‍යතා හා වුවමනා තනිව සපුරා ගැනීමට නොහැකි නිසා එම අවශ්‍යතා හා වුවමනා ඉටුකර දීම සඳහා ව්‍යාපාර වැදගත්වේ.

(මෙම අදහස පැහැදිලි කිරීමට ලකුණු 01)

(i) (අ) අයිතිකරුවන්/කළමනාකරුවන්/සේවකයින්/සංවිධාන ව්‍යුහය/සංවිධාන සංස්කෘතිය /සම්පත්

(ඕනෑම සාධක දෙකකට 1/2 බැගින් ලකුණු 01)

(i) අයිතිකරුවන් - උදා: අයිතිකරුවන්ගේ සංඛ්‍යාව, ව්‍යාපාරික දැනුම,ව්‍යාපාරික පලපුරුද්ද, මූල්‍ය ශක්තිය, අයිතිකරුගේ කීර්තිනාමය, දැක්ම, කැපවීම හා නායකත්වය.

(ii) කළමනාකරුවන් - උදා: නිවැරදි තීරණ ගැනීම, කළමනාකරණ දක්ෂතා, කළමනාකරුගේ කැපවීම

(iii) සේවකයන් - උදා: පුහුණුව, පක්ෂපාතී බව, අභිප්‍රේරණය වූ සේවකයන්, සේවක දක්ෂතා, කැපවීම

(iv) සංවිධාන සංස්කෘතිය - උදා: ඇල්මැති පාර්ශවයන් සංස්කෘතිය පිළිගැනීම, අනුගත වීම, අරමුණු ඉටුකර ගැනීමට සහායවීම

(v) සංවිධාන ව්‍යුහය - උදා: නම්‍යතාවය, සරල වීම, බලතල බෙදී යාමේ ස්වභාවය

(vi) සම්පත් - උදා: ප්‍රමාණවත්ව පැවතීම, ගුණාත්මක බවින් යුක්ත වීම, අදාළ වීම, ලබා ගතහැකි බව, යාවත්කාලීනවීම

මෙම කරුණු ව්‍යාපාරයක සාර්ථකත්වයට බලපාන අන්දම පැහැදිලි කල යුතුය.
(පාර්ශවයන් දෙකක් නම් කිරීමට ලකුණු 01 යි. සාර්ථකත්වයට බලපාන හේතු දෙකකට ලකුණු 1/2 බැගින් ලකුණු 01 යි)

(ආ) දේශපාලන හා නෛතික පරිසරය/ආර්ථික පරිසරය/සමාජයීය හා සංස්කෘත පරිසරය /තාක්ෂණික පරිසරය/ප්‍රජා පරිසරය/ස්වභාවික පරිසරය/ගෝලීය පරිසරය

(සාධක 02 ක් නම් කිරීමට ලකුණු 01 යි)

(i) දේශපාලන හා නෛතික පරිසරය - උදා: දේශපාලන අස්ථාවර බව, දැඩි නීතිරීති, අහිතකර ප්‍රතිපත්ති, අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම.

(ii) ආර්ථික පරිසරය - උදා: උද්ධමනය, ඉහළ පොළී අනුපාතය, අහිතකර ආර්ථික ප්‍රතිපත්ති, මිළ මට්ටම ඉහළ යාම, ඒක පුද්ගල ආදායම අඩුවීම.

(iii) සමාජයීය හා සංස්කෘතික පරිසරය - උදා: සමාජයේ වෙසෙන ජනතාවගේ සිතුම් පැතුම්, චාරිත්‍ර වාරිත්‍ර, අගනාකම්, ආකල්ප, සාරධර්ම සමාජ සංවිධාන ආදිය අහිතකර ලෙස බලපෑම

(iv) තාක්ෂණික පරිසරය - උදා: තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස්වීම, තාක්ෂණය ලබා ගැනීමට වැඩි පිරිවැයක් දැරිය යුතු වීම, පුහුණු සේවක හිඟය, තාක්ෂණික දැනුම මඳබව, නොගැලපීම

(v) ප්‍රජා පරිසරය - උදා: ජන සංයුතිය, පවුල් සංයුතිය, ජීවන රටාව, අධ්‍යාපන දැනුම මඳ බව, ආදායම, ක්‍රය ශක්තිය ආදිය අහිතකර ලෙස බලපෑම.

(vi) ස්වභාවික පරිසරය - උදා: සම්පත් හිඟකම, දේශගුණික හා කාලගුණික විපර්යාස, පරිසර දූෂණය

(vii) ගෝලීය පරිසරය - උදා :ඇඩි තරගකාරීත්වය, අන්තර්ජාතික සංවිධානවල බලපෑම, ජාත්‍යන්තර නීතිරීති, වෙළෙඳ ගිවිසුම්, රටවල් අතර ගැටුම්, සම්බාධක

- මෙම කරුණු ව්‍යාපාරයක අසාර්ථකත්වයට බලපාන අන්දම පැහැදිලි කල යුතුය. **(පරිසර සාධක 02ක් සඳහන් කිරීමට ලකුණු 01 යි. අසාර්ථකත්වයට බලපාන හේතු 02 ක් සඳහන් කිරීමට 1/2 බැගින් ලකුණු 01 යි)**

(iii) (අ) බැංකු/රක්‍ෂණ/ප්‍රවාහන/ගබඩා/සන්නිවේදනය/මූල්‍ය

(කරුණු 02 ට ලකුණු 02 යි)

(ආ) ගෘහ සේවා පුහුණු නුපුහුණු ශ්‍රමය/අළුත්වැඩියා සේවා/මූල්‍ය සේවා/වරාය හා ගුවන් තොටුපොල සේවා/මෘදුකාංග/දත්ත සැකසුම්/ආරක්‍ෂක සේවා/ උපදේශන සේවා

(කරුණු 02 ලකුණු 02 යි)

(iv) (අ)
1. සේවක ආකර්ෂණය වැඩිකර ගැනීමට හැකි වීම.
2. කීර්තිනාමය වැඩිවීම
3. ලාභය වැඩිවීම/ ගණුදෙනුකරුවන් වැඩිවීම/ පාරිභෝගික පක්ෂපාතීත්වය වැඩිවීම
4. ආයෝජකයන්ගේ ආකර්ෂණය වැඩිවීම.
5. ආයතනය පිළිබඳ හොඳ ආකල්පයක් සමාජයේ ඇතිවීම.
6. විරුද්ධවාදීන් අඩුවීම.
7. තරගකාරිත්වය පහසුවීම.
8. රජයේ අනුග්‍රහය ලබා ගැනීමට හැකිවීම.

(කරුණු 04 කට 1/2 බැගින් ලකුණු 02 යි)

(අ)

සැලකිලිමත්විය යුතු සාධක	උදාහරණ
ව්‍යාපාරයේ ස්වභාවය	අයිතිය, නිෂ්පාදනයේ හෝ සේවාවේ ස්වභාවය
ගනුදෙනුකරුවන්	පසුබිම, ඔවුන්ගේ පරිභෝජන රටාව, භාෂාව සහ සන්නිවේදනයේ ස්වභාවය
තරගකරුවන්	තරගකරුවන්ගේ ස්වභාවය, ඔවුන් සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුම්, තරගකාරිත්වයේ ස්වභාවය
සමාජ සංස්කෘතිය	සමාජ සාරධර්ම සහ වටිනාකම්, උප සංස්කෘතීන්

ප්‍රායෝගික බව	ආචාරධර්ම කොතරම් දුරට පිළිගන්නේ ද රට පිළිගන්නේද, ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහයේ ස්වභාවය, පවතින නීති රීති රාමුව, ක්‍රියාත්මක කිරීමේ වියදම
සේවකයෝ	සේවකයන්ගේ පසුබිම, ඔවුන්ගේ හැසිරීම් ස්වභාවය, සේවක සංවිධාන
සංවිධාන සංස්කෘතිය	ව්‍යුහාත්මක සැකසුම, බලතල වගකීම් හා පැවරුම

(උදාහරණ සහිතව සාධක 2ක් විස්තර කිරීමට 1 බැගින් ලකුණු 02 යි)
(සාධක 2ක් නම් කිරීමට පමණක් ලකුණු 01 යි)


(v)
1. නිෂ්පාදන අදියර තුනක ක්‍රියාවලියක් බව
2. නිෂ්පාදනයේ සමස්ථ ගුණත්වයට සෑම ක්‍රියාවලියක්ම බලපාන බව
3. අමුද්‍රව්‍ය වල ගුණත්වය වැඩි කිරීම ක්‍රියාවලියේ එක් අවස්ථාවක් පමණක් දියුණු කිරීමකි
4. යෝගට්වල සමස්ථ ගුණත්වය වැඩි කිරීමට නම් ක්‍රියාවලියේ සෑම අවස්ථාවක්ම වැඩි දියුණු කිරීම අවශ්‍ය බව

(පැහැදිලි කිරීමේ දී එක් කරුණකට ලකුණු 1/2 බැගින් ලකුණු 04 යි)

(කරුණු 4 නම් කිරීමට පමණක් ලකුණු 02 යි)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසින් වැඩිම සිසුන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සියලුම සිසුන් තෝරාගෙන ඇත.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 49%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 18%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 67%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 34%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.

1 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව



1 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයේ අනුකොටස් 9ක් ඇති අතර (v) වන අනුකොටස අඩුම පහසුතාවක් දක්වන අතර එය 31%කි. වැඩිම පහසුතාවයක් දක්වන්නේ (iii) (a) අනුකොටස වන අතර එය 92%කි.

පළමුවන ප්‍රශ්නයේ (i)(a) හා (i)(b) අනුකොටස් 2හි පහසුතාව පිළිවෙළින් 50% හා 76% වේ. (i)(a) අනුකොටසේ පහසුතාව පහළ යාමට හේතුව වන්නේ විධිමත් ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ නිශ්චිතව දැක්වීම වෙනුවට ව්‍යාපාර අරමුණු හෝ ව්‍යාපාර කාර්යයන් ලියා තිබීමයි. එම නිසා ව්‍යාපාර සංවිධානයක පොදු ලක්ෂණ, අරමුණු හා කාර්යයන් වෙන වෙනම හඳුනා ගැනීමටත්, වෙන් කර දැක්වීමටත් පංති කාමරය තුළදී සිසුන්ට මඟ පෙන්වීම වැදගත් වේ.

(iii) (b) අනුකොටසෙහි පහසුතාව 45% කි. එයට හේතුව මෙහිදී ශ්‍රී ලංකාවේ අපනයනය කරනු ලබන වෙනත් සේවා පිළිතුරු ලෙස ඉදිරිපත් කර නොතිබූ අතර බොහෝ සිසුන් මැදපෙරදිග ගෘහ සේවය පමණක් සඳහන් කර තිබීමයි. එමනිසා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන වෙනත් සේවාවන් ලෙස මූල්‍ය සේවා, වරාය හා ගුවන්තොටුපල සේවා, අලුත්වැඩියා සේවා, දත්ත සැකසුම්, මෘදුකාංග වැනි සේවාවන් ද පවතින බව සිසුන්ට අවබෝධ කරදිය යුතුය.

(iv) (b) අනුකොටසෙහි පහසුතාව 44% කි. මෙහි දී බොහෝ දෙනා ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් සැකසීමේදී සැලකිලිමත් විය යුතු සාධක පමණක් සඳහන් කර තිබූ අතර ඒවා උදාහරණ සහිතව විස්තර කිරීමට අපොහොසත් වී ඇත. නිදසුන් සහිතව පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා නියමිත ආකාරයට පිළිතුරු ලිවීමට සිසුන් පුරුදු පුහුණු කළ යුතුය.

(v) කොටසෙහි පහසුතාවය 31% කි. ගුණාත්මයෙන් යුතු අමුද්‍රව්‍ය භාවිතයෙන් පමණක් නිෂ්පාදිතයේ ගුණාත්මය ඉහළ දැමිය හැකි ලෙසට පිළිතුරු ලියා තිබීමයි. සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ අදියර තුන කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ගුණාත්මයෙන් ඉහළ නිෂ්පාදිතයක් අපේක්ෂා කළ හැකි බව සිසුන්ට අවබෝධ වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුයි.

2. (i) (අ) ව්‍යාපාරයකට රටක ආර්ථික සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න.

(ආ) පාරිභෝගික අයිතිවාසිකම් **දෙකක්** නම් කර, ඒවා සුරැකීම සඳහා ව්‍යාපාරිකයකු විසින් ඉටු කළ යුතු යුතුකම් මොනවා දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ශ්‍රී ලංකාවේ ඇතැම් ව්‍යාපාරිකයින් විසින් සිදු කරනු ලබන වෙළෙඳ විෂමාචාර **හතරක්** සඳහන් කරන්න.

(ආ) එම විෂමාචාර වැළැක්වීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) හවුල් ව්‍යාපාරයක්, වරලත් ව්‍යාපාරයකින් වෙනස් වන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න.

(ආ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ වරලත් ව්‍යාපාර ආරම්භ කිරීම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්නට ලැබේ. වරලත් ව්‍යාපාරයකින් වරලත්ලාභියකුට ලබාගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) **ශ්‍රී ලංකාවේ රජය නිෂ්පාදන අංශයට වඩා සේවා අංශයෙහි ව්‍යාපාරවල නියුක්තවීමට වැඩි ප්‍රමුඛතාවක් දෙනු ලැබේ. එසේ වැඩි ප්‍රමුඛතාවක් ලබා දීමට බලපාන හේතු උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.**

(ආ) "**රජයක් සිය අරමුණු ඉටුකර ගැනීමේ දී ව්‍යාපාර අංශයෙන් සහයෝගය අපේක්ෂා කරන අතර ව්‍යාපාර** අංශය ද එම අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ ආකාරයෙන් සිය දායකත්වය ලබා දේ." මෙම ප්‍රකාශය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) **දේශීය ගොවීන් ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් ආනයනික අර්තාපල් හා ලූණු සඳහා බද්දක් අය කිරීමට යෝජනා කර ඇත. මෙම බදු අය කිරීම තුළින් දේශීය ගොවීන්ට සහ පාරිභෝගිකයින්ට ඇති විය හැකි බලපෑම් පැහැදිලි කරන්න.** (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

2. **(i)** (අ) (1) නියමිත පරිදි බදු ගෙවීමෙන්
(2) දේශීය සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම මගින්
(3) සේවා නියුක්තියට දායක වීම මගින්
(4) රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම මගින්
(5) දළ දේශීය නිෂ්පාදිතය වර්ධනයට දායක වීම මගින්
(6) නවෝත්පාදන බිහි කිරීම මගින්
(7) පරිසරය සුරැකෙන අයුරින් ව්‍යාපාර කටයුතු සිදුකිරීමෙන්
(8) විදේශ විනිමය ඉපයීමට දායකවීමෙන්
(9) ප්‍රාදේශීයව ව්‍යාපාර ව්‍යාප්ත කරමින් ප්‍රාදේශීය සංවර්ධනයට දායකවීමෙන්
(10) ජීවන තත්ත්වය උසස් කිරීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

(ආ) අයිතිවාසිකම්
(1) ආරක්ෂාව සළසා ගැනීමේ අයිතිය
(2) තොරතුරු දැනගැනීමේ අයිතිය
(3) තෝරාගැනීමට ඇති අයිතිය
(4) සවන් යොමුකරවා ගැනීමට ඇති අයිතිය
(5) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය
(6) වන්දි ලබා ගැනීමට ඇති අයිතිය
(7) පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
(8) සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01)

ව්‍යාපාරිකයා ඉටුකළ යුතු යුතුකම්
(1) පාරිභෝගිකයන් සම්බන්ධව පනවා ඇති නිතී රීතී පිළිපැදීම
(2) පාරිභෝගික ආරක්ෂාව පිළිබඳව සැළැකිලිමත්වීම
(3) ගුණත්වයෙන් උසස් භාණ්ඩ සැපයීම
(4) පාරිභෝගිකයන්ට නිවැරදි තොරතුරු ලබාදීම හා දැනුවත් කිරීම
(5) පාරිභෝගික විශ්වාසය කඩ නොවන අයුරින් කටයුතු කිරීම
(6) පරිසරයට හානි නොවන අයුරින් ව්‍යාපාර කටයුතු සිදුකිරීම
(7) ව්‍යාපාරිකයින් අතර පොදු සම්මුතීන් ගොඩනගා ගැනීම

(8) පාරිභෝගික දුක් ගැනවිලි හා පැමිණිලි ලබාගැනීමට ක්‍රමයක් ඇතිකිරීම, සවන් යොමු කිරීම හා ඒ පිළිබඳව ක්‍රියාත්මකවීම

(9) ස්වයං ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීම හා පිළිපැදීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01)

(ii) (අ) (1) ගුණත්වයෙන් අඩු භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත්කිරීම

(2) අසාධාරණ මිල නියමකිරීම

(3) ජනප්‍රිය සන්නම් යටතේ බාලභාණ්ඩ ඉදිරිපත්කිරීම

(4) අයථා ප්‍රචාරණ කටයුතු සිදුකිරීම

(5) භාණ්ඩ සඟවා හිඟයක් මවාපෑම

(6) අසත්‍ය තොරතුරු ලබාදීම

(7) කිරුම් මිනුම් අක්‍රමිකතා සිදුකිරීම

(8) පාරිභෝගිකයා රැවටීම සඳහා නොයෙක් උපක්‍රම භාවිතය

(9) ගිණුම් විකෘති කිරීම

(10) විකිණීමේදී කොන්දේසි පැනවීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

(ආ) (1) පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

(2) නිතීරීති සම්පාදනය

(3) නිතර නිතර වැටලීම් සිදුකිරීම

(4) විෂමාචාර කරන වෙළෙඳුන්ට දඩුවම් ලබාදීම හා එම දඩුවම් ප්‍රසිද්ධකිරීම

(5) පාලන මිල නියමකිරීම

(6) භාණ්ඩ හා සේවාවන් හි ගුණත්වය නිරන්තරයෙන් පරීක්ෂාවට ලක්කිරීම

(7) ප්‍රමිති හඳුන්වා දීම හා ක්‍රියාත්මකකිරීම

(8) යහපත් පිළිවෙත් අනුගමනය කරන ව්‍යාපාර අගයකිරීම

(9) පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන විධිමත්කිරීම

(10) පාරිභෝගික සමිති සංවිධාන ඇතිකිරීම හා වර්ධනය

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

(iii) (අ)

හවුල් ව්‍යාපාරය	වරලත් ව්‍යාපාරය
හවුල් කරුවන් අතර ඇතිවන ගිවිසුමක් මගින් ආරම්භ වේ. සරල වේ.	වරලත්හිමියා හා වරලත් ලාභියා අතර ඇතිවන ගිවිසුමක් මගින් ආරම්භ වේ. සංකීර්ණ වේ.
ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කිරීමට නිදහස ඇත.	වරලත් හිමියාගේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුවේ.
අවදානම වැඩිය.	අවදානම අඩුය
ලාභය හවුල්කරුවන් අතර බෙදේ.	ලාභයෙන් කොටසක් පුරස්කාර ලෙස ගෙවිය යුතුය.
සන්නම හා වෙළෙඳ ලකුණු පිළිබඳව ඇඩි අවධානයක් යොමු නොකෙරේ.	සන්නම හා වෙළෙඳ ලකුණට වැඩි අවධානයක් යොමු කෙරේ.
භාණ්ඩය හා සේවය පිළිබඳ තමන්ට තීරණය කළ හැකිය	භාණ්ඩය හා සේවා වරලත් හිමියාගේ කොන්දේසි අනුව තීරණය වේ.

(එක් සැසඳීමකට ලකුණු 01 බැගින් දෙකකට ලකුණු 02)

(ආ) (1) පහසුවෙන් වෙළෙඳපොළට පිවිසීමේ හැකියාව

(2) ප්‍රසිද්ධ සන්නමක් භාවිතා කිරීමට හැකිවීමෙන් ලාභ ලැබිය හැකිවීම

(3) විශාල වෙළෙඳපොළක් ලබා ගැනීමට හැකිවීම

(4) කළමනාකරණ පුහුණුව හා වෙනත් පහසුකම් ලැබීම

(5) ප්‍රවර්ධනය පහසු වීම

(6) අවදානම අඩුවීම

(7) ආරම්භයේ සිටම ලාභ ලැබිය හැකිවීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

(iv) (අ) (1) සේවා අංශයේ ඉල්ලුම ඉහළයාම උදා: සෞඛ්‍ය, අධ්‍යාපනය

(2) අත්‍යවශ්‍ය සේවා සැපයීම රජය විසින් කළයුතුවීම උදා: විදුලිය, ජලය, ආරක්ෂක සේවා

(3) මහජන සුභ සාධනය රජයේ කාර්යයක් වීම උදා: නොමිලේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් ලබා දීම

(4) පෞද්ගලික අංශයෙන් සේවා සැපයීමේ දී ඇතිවන දුර්වලතා මගහරවා ගැනීමට
උදා: ප්‍රවාහන සේවා, වෙළෙඳ කටයුතු

(5) රජය යටතේ තිබූ නිෂ්පාදන කර්මාන්ත අසාර්ථකවීම නිසා ඒ වෙනුවට සේවා අංශයට යොමුවීම
උදා: සිමෙන්ති සංස්ථාව, පිගන් සංස්ථාව වැනි නිෂ්පාදන කර්මාන්ත අසාර්ථකවීම

(6) රජයේ අයවැය ලේඛනයෙන් සේවා සඳහා විශාල මුදලක් වෙන් කිරීමට විවිධ සංවිධාන විසින් කරනු ලබන බලපෑම්
උදා: අධ්‍යාපනය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% වෙන් කිරීමට කරන බලපෑම්

(7) පෞද්ගලික අංශය නිෂ්පාදන කර්මාන්ත සඳහා ඉදිරිපත් වුවද ලාභ නොලබන සේවා අංශයට ඉදිරිපත් වීමට මැලිවීම

(උදාහරණයක් සහිතව එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02)
(උදාහරණ නොමැති නම් එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01 යි)

(ආ)

අරමුණු	දායකවන ආකාරය
(1) ක්‍රමික ආර්ථික වර්ධනය හා සංවර්ධනය	- දළ දේශීය නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය, නවෝත්පාදනය
(2) පූර්ණසේවා නියුක්තිය	- නවරැකියා අවස්ථා ඇතිකිරීම
(3) ආර්ථික ස්ථායීතාව	- මිල මට්ටම උච්චාවචනයන්ගෙන් තොරව පවත්වා ගෙනයාම
(4) සාධාරණ ආදායම් ව්‍යාප්තිය	- ප්‍රාදේශීය සම්පත් භාවිතය හා ව්‍යාපාර ප්‍රාදේශීයව ව්‍යාප්ත කිරීම
(5) යහපත් අන්තර් ජාතික වෙළෙඳාම	- අපනයනාභිමුඛ කර්මාන්ත වර්ධනය
(6) තිරසාර සංවර්ධනය	- පරිසරය සුරැකෙන අයුරින් ව්‍යාපාර කටයුතු සිදුකිරීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02)

(v) දේශීය ගොවීන්ට

(1) නිෂ්පාදිත සඳහා ඉහළ මිලක් ලැබීම
(2) හොඳ වෙළෙඳපොලක් ලැබීම
(3) තම නිෂ්පාදන කර්මාන්ත ආරක්‍ෂාවීම
(4) නිෂ්පාදන කටයුතු පුලුල් කිරීමේ හැකියාව
(5) තරගකාරීත්වය අඩුවීම නිසා නිෂ්පාදනයේ කාර්යක්‍ෂමතාව අඩුවීම
(6) කර්මාන්තයට ප්‍රවේශවන දේශීය ගොවීන් ඉහළයාමෙන් සැපයුම වැඩි වී දිගුකාලයේ දී මිල පහළයාම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)


පාරිභෝගිකයාට

(1) නැවුම් දේශීය නිෂ්පාදන මිලදී ගැනිමේ හැකියාව ලැබීම
(2) නිෂ්පාදිත මිල ඉහළ යාම
(3) තෝරා ගැනීමේ ඉඩකඩ අඩුවීම
(4) විදේශ නිෂ්පාදිත පරිභෝජනයට ඇති අවස්ථාව අහිමිවීම
(5) දේශීය නිෂ්පාදිතවල ගුණත්වය අඩු වුවත් මිලදී ගැනීමට සිදුවීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු හතරකට ලකුණු 02)

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

2 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




2 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 94%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 43%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 12%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 55%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 45%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.

2 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව



2 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9කි. (iv) (a) අනුකොටස සඳහා 31% වූ අඩුම පහසුතාව දක්වයි. වැඩිම පහසුතාවක් දක්වන්නේ (ii) (a) අනුකොටස වන අතර එය 83%කි.

(iii) (a) අනුකොටසෙහි පහසුතාව 42%ක් වීමට හේතුව හවුල් ව්‍යාපාරයක් සහ වරලත් ව්‍යාපාරයක් අතර වෙනස සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම වෙනුවට සිසුන් පිළිතුරු ලෙස දක්වා තිබුණේ හවුල් ව්‍යාපාර හා වරලත් ව්‍යාපාර වෙන වෙනම අර්ථ දැක්වීමයි. එම නිසා සංසන්දනාත්මක පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා නිවැරදිව පිළිතුරු සංවිධානය කිරීමට සිසුන් හුරු කළ යුතුය.

(iv) (a) අනුකොටසෙහි පහසුතාව 31%ක් වූ අඩුම පහසුතාවය පෙන්වීමට බලපා ඇත්තේ ප්‍රශ්නය නිවැරදිව වටහා ගැනීමට සිසුන්ට නොහැකි වීම සහ සේවා අංශයෙහි ව්‍යාපාරවල නියුක්ත වීමට බලපාන හේතු වෙනුවට සේවාවල වර්ධනයක් පෙන්වා ඇති අංශ ලියා දැක්වීමයි.

(v) කොටසෙහි පහසුතාව 37%කි. රජය විසින් ආනයනික භාණ්ඩ මත බද්දක් පැනවීමේදී විවිධ පාර්ශවයන්ට (ගොවීන්ට, පාරිභෝගිකයන්ට) ඇතිවන බලපෑම වෙන් වෙන් වශයෙන් නිරවුල්ව අවබෝධ කරගෙන නොතිබීම මෙයට හේතුවයි. වර්තමාන ආර්ථිකය තුළ ඇති ප්‍රායෝගික උදාහරණ භාවිතයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම තුළින් මේ තත්ත්වයන් දරුවන් තුළ තහවුරු කළ හැකිය.

3. (i) (අ) ව්‍යවසායකත්වය, රටක දියුණුවට අත්‍යවශ්‍ය සාධකයකි. මෙම අදහස උදාහරණ **හතරක්** දක්වමින් පැහැදිලි කරන්න.

(ආ) සිරිපාලගේ පියා සාර්ථක ව්‍යාපාරිකයෙකි. සිරිපාලට ද ඇතැම් ව්‍යවසායක කුසලතා පැවැතුන ද, ඔහුගේ පියා විසින් නිරතුරු ව අවධාරණය කර සිටින්නේ තවදුරටත් ඔහු විසින් ඔහුගේ ව්‍යවසායක කුසලතා වර්ධනය කරගත යුතු බව ය. සිරිපාල හට ව්‍යවසායක කුසලතා වර්ධනය කරගත හැකි මාර්ග **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(ii) රුපියල් මිලියන දෙකක මුදලක් ඔබ අත ඇත්නම් එම මුදල ඉඩමක් මිල දී ගැනීමට වැය කරන්නේ ද, නැතිනම් කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කරන්නේ ද? ඔබ ගන්නා තීරණය මෙම විකල්ප දෙක සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට වඩා සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම කෙරෙහි පුද්ගලයින් උනන්දු වීමට බලපාන හේතු **හතරක්** පැහැදිලි කරන්න.

(ආ) දැඩි තරගකාරිත්වයට මුහුණ දී සිටින සුළු පරිමාණ සිල්ලර ව්‍යාපාරිකයකු හට පාරිභෝගිකයින් අද්දවා ගැනීමට ගත හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) දාතම, මුදල (අකුරෙන් හා ඉලක්කමෙන්) සහ අත්සන නිවැරදි ව මුදල් චෙක්පතක සඳහන් කර තිබුණද බැංකු අයකැමි විසින් එම චෙක්පතට බැංකු කවුන්ටරයෙන් මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. එලෙස මුදල් නොගෙවීමට හේතුවිය හැකි කරුණු **හතරක්** ලියන්න.

(ආ) වාණිජ බැංකු විසින් ව්‍යාපාර සඳහා විවිධාකාරයේ සේවා සපයනු ලැබේ. එවැනි සේවා **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) "සමූපකාර ග්‍රාමීය බැංකුවක් වෙනත් වාණිජ බැංකුවකින් වෙනස් නොවේ." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සමාගම්වල සීඝ්‍ර වර්ධනයක් වර්තමානයේ දක්නට ලැබේ. එසේ මූල්‍ය සමාගම් සීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

3. (i) (අ) (1) ආර්ථිකයේ පවත්නා ගැටලුවලට නව විසඳුම් සෙවිය හැකිවීම
(2) නව ව්‍යාපාර බිහිවීම නිසා නව රැකියා අවස්ථා ජනිතවීම
(3) තරුණ පරම්පරාව ඔවුන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට යොමුවීම
(4) නව ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන නව වෙළෙඳපොළවල් බිහිකිරීම නිසා ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කර ගත හැකිවීම
(5) නව භාණ්ඩ හා සේවා පරිභෝජනය නිසා ජනතාවගේ ජීවන තත්ත්වය උසස්වීම
(6) ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රයෝජනයට ගැනීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනය
(7) පවත්නා ව්‍යාපාර නවීකරණය තුළින් ව්‍යාපාරවල පැවැත්ම තහවුරුවීම
(8) රැකියා ලබා ගැනීම යන සංකල්පයෙන් බැහැර වී තමන්ගේම ව්‍යාපාර ඇරඹීමට පෙළඹීම
(9) නව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය තුළින් ආදායම් විෂමතාවය අවමවීම

උදාහරණ අවශ්‍යමයි. **(1/2 බැගින් කරුණු 04 ක් සඳහා ලකුණු 02)**

(ආ) (1) විවිධ ක්ෂේත්‍ර පිළිබඳව විධිමත් අධ්‍යාපනය ලබාගැනීම
(2) පියාගේ අත්දැකීම් හා පලපුරුද්ද මගින්
(3) ආදර්ශ චරිත අධ්‍යයනය
(4) විදේශගත අධ්‍යාපනය හා පුහුණුව තුළින්
(5) පියාගේ ව්‍යාපාරයට සම්බන්ධ වී අත්දැකීම් ලබාගැනීම
(6) පියාගෙන් වෙන් වී තමාගේම ව්‍යාපාර කටයුතුවල යෙදීමෙන් අත්දැකීම් ලබාගැනීම
(7) විවිධ අත්හදා බැලීම් කිරීම තුළින්.
(8) පොතපත කියවීම
(9) උපදේශකවරයෙකුගේ මඟපෙන්වීම ලබාගැනීම.
(10) විශේෂ පුහුණුවක් ලබාදීම

(කරුණු 04 ට 1/2 බැගින් ලකුණු 02)

(ii)

ඉඩමක් මිලදී ගැනීම	කොටස් මිලදී ගැනීම
1. අවදානම අඩුය.	1. අවදානම වැඩිය.
2. ද්‍රවශීලතාවය අඩුය.	2. ද්‍රවශීලතාවය වැඩිය.
3. භාවිතා කළ හැකි විකල්ප ක්‍රම වැඩිවේ.	3. භාවිතා කල හැකි විකල්ප ක්‍රම අඩුය.
4. පැවරීම සංකීර්ණය.	4. පහසුවෙන් පැවරිය හැක.
5. මූලික පිරිවැය වැඩියි.	5. මූලික පිරිවැය අඩුයි.
කරුණු 3 ට ලකුණු 1/2	**කරුණු 3 ට ලකුණු 1 1/2**

(තෝරාගන්නා විකල්පය තර්කානුකූලව ඉදිරිපත් කිරීමට ලකුණු 01 යි)

(iii) (අ) (1) අඩු ප්‍රාග්ධනයකින් ආරම්භ කිරීමේ හැකියාව
(2) නීතිරීති අවමවීම
(3) ඕනෑම තැනක ආරම්භ කළ හැකිවීම
(4) සීමිත ඉල්ලුමක් ඇති ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජනගත හැකිවීම
(5) වෙනත් අය ආරම්භ නොකරන ව්‍යාපාර ආරම්භ කළ හැකිවීම
(6) තම දක්ෂතාවලින් උපරිම ප්‍රයෝජන ගත හැකිවීම
(7) කැපවීම මත ප්‍රතිලාභ ලබාගත හැකිවීම
(8) රජයේ දිරිගැන්වීම් ලබා ගැනීමට
(9) නිර්මාණශීලීබව
(10) තෘප්තිය වර්ධනය වේ. **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ) (1) පාරිභෝගික සම්බන්ධතා වර්ධනය කිරීම
(2) ගණුදෙනුකරුවන්ගේ පක්ෂපාතීත්වය ලබාගැනීම
(3) මිළ අඩු කිරීම මගින් තරගයට මුහුණදීම
(4) පාරිභෝගික ප්‍රවර්ධන ක්‍රම වැඩිකිරීම
(5) ව්‍යාපාර ස්ථානය තුල සිත් ඇදගන්නා හා තෘප්තිමත් භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම
(6) වෙළෙඳ සැලේ කටයුතු නවීකරණය කිරීම
(7) භාණ්ඩ නිවසට ගෙන ගොස් භාරදීම
(8) ස්වයංසේවා ක්‍රමය ක්‍රියාත්මක කිරීම **(කරුණු 04 ට ලකුණු 02)**

(iv) (අ) (1) චෙක්පත රේඛනය කර තිබීම
(2) විධානයට හෝ රැගෙන එන්නාට යන යෙදුම කපාහැර තිබීම
} **(කරුණු 02 ට ලකුණු 01)**

(3) ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැතිවීම
(4) අණකරු විසින් ගෙවීම අත්හිටුවා තිබීම
(5) ගානිෂී නියෝගයක් ලැබීම
(6) චෙක්පතට හානි සිදුවීම
(7) අණකරු බුන්වත්වීම හෝ මරණයට පත්වීම
} **(ඕනෑම කරුණු 02 කට ලකුණු 01)**

(ආ) (1) විවිධ තැන්පතු පවත්වාගෙන යාම
(2) ණය පහසුකම් සැලසීම
(3) කල්බදු සේවා
(4) ණය වර ලිපි සේවා
(5) සුරක්ෂිතාගාර පහසුකම්
(6) විදේශ විනිමය විකිණීම හා මිලදී ගැනීම
(7) නියෝජිත සේවා
(8) ස්වයංක්‍රීය බැංකු සේවා
(9) ණයපත්/හරපත් ක්‍රියාත්මක කිරීම
(10) ටෙලි බැන්කින්
(11) අන්තර්ජාල බැංකු කරණය
(12) උකස් කටයුතු
(13) මුදල් ප්‍රේෂණ කටයුතු **(ඕනෑම කරුණු 04ක් සඳහා ලකුණු 02)**

(v)(අ) නැත (වෙනස්වේ) ඔව් නම් ලකුණු හිමි නොවේ. (ලකුණු 1/2)


සමූපකාර ග්‍රාමීය බැංකු	වානිජ බැංකු
1. ජංගම ගිණුම් පවත්වා ගෙන යා නොහැකිය.	1. ජංගම ගිණුම් පවත්වා ගෙන යයි.
2. විදේශ විනිමය ගණුදෙනුවල නිරත නොවේ.	2. විදේශ විනිමය ගණුදෙනුවල නිරත වේ.
3. තැන්පත් භාරගන්නා අනෙකුත් මූල්‍යායතන වර්ගයට අයත් වේ.	3. බැංකු අංශයට අයත් වේ.
4. සමූපකාර සමිති මගින් විගණනය	4. මහ බැංකුවේ විගණනයට ලක් වේ.
5. සමූපකාර ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වේ.	5. වාණිජ බැංකු ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වේ.
6. විශාල ගනුදෙනු සිදු නොකරයි. (ලක්ෂ 5ට අඩු)	6. විශාල ගනුදෙනු සිදු කරයි.

(වෙනස්කම් 03 කට ලකුණු 1/2 බැගින් ලකුණු 1 1/2 යි)

(ආ) (1) අනෙකුත් බැංකු හා සමහර මූල්‍යායතනවලින් සේවා ලබා ගැනීමේ අපහසුතා
(2) ගණුදෙනුකරු මූලික කරගත් කාර්යයන් හි නිරතවීම
(3) වැඩි ලාභයක් ඉපයිය හැකිවීම
(4) රටේ ව්‍යාපාර කටයුතුවල වර්ධනය
(5) මුල්‍ය සමාගම් ආරම්භ කිරීම සඳහා පැවැති බාධා ඉවත්වීම
(6) රජයෙන් ලැබෙන දිරිගැන්වීම් වැඩිවීම
(7) මුල්‍ය වෙළෙඳපොලේ සිදු වූ වර්ධනය
(8) මුල්‍ය සමාගම් අතරේ තරගකාරිත්වය වර්ධනය
(9) ව්‍යාපාර කටයුතු වර්ධනය වීමට හිතකර වාතාවරණයක් ඇතිවීම

(ඕනෑම කරුණු 04 කට ලකුණු 02 යි)


3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 76%කි. (ප්‍රස්තාරය 02). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 45%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 7%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 43%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 57%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 9 අතුරෙන් වැඩිම පහසුතාව වූ 71% පෙන්වා ඇත්තේ (iii) (b) අනුකොටසට වන අතර, අඩුම පහසුතාව වූ 29% පෙන්වා ඇත්තේ (v) (b) අනුකොටසෙහි ය.

(ii) අනුකොටසේ පහසුතාව 32%ක් වේ. එයට හේතුව සිද්ධියක් ආශ්‍රයෙන් සංසන්දනාත්මකව පිළිතුරු සැපයීමට ආයදුම්කරුවන්ට නොහැකිවීමය. එම නිසා සිද්ධියක් මැනවින් අධ්‍යයනය කොට අවබෝධ කරගෙන පිළිතුරු ලිවීමට අයදුම්කරුවන් වැඩි වශයෙන් පුරුදු පුහුණු කළ යුතුය. සිද්ධිය ආශ්‍රයෙන්ම ප්‍රශ්න ගොඩ නැගීමටත්, හැකිතාක් පිළිතුරු සිද්ධිය තුළට සීමා කිරීමටත් වගබලා ගත යුතුය. ප්‍රශ්නයෙන් විමසන තීරණය විකල්ප දෙක සැසඳීම වෙනුවට සිසුන් පිළිතුරු ලෙස ලියා තිබුණේ තීරණය දැක්වීම හෝ විකල්ප දෙක සැසඳීම පමණි. මෙවැනි ප්‍රශ්නවලදී අවසාන නිගමනය සාධාරණීයකරණය කිරීමට තර්කානුකූල හේතු ඉදිරිපත් කිරීමට සිසුන් ප්‍රායෝගිකව පුහුණු කළ යුතුය.

(v)(b) අනුකොටසෙහි අඩුම පහසුතාවය වූ 29%ක් පෙන්නුම් කරයි. එසේ පහසුතාවය පහළ යාමට හේතුව ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සමාගම් සීඝ්‍ර වර්ධනයට බලපෑ හේතු දැක්වීමට අයදුම්කරුවන් අපොහොසත් වීමය. එම නිසා ප්‍රශ්නයේ හරය නිවැරදිව වටහා ගැනීමට සිසුන් දැනුවත් කිරීම වැදගත් වේ. මෙහිදී සිසුන් පිළිතුරු ලෙස සඳහන් කර තිබුණේ මූල්‍ය සමාගම් වර්ධනයට බලපෑ හේතු වෙනුවට මූල්‍ය සමාගම්වලින් ලැබෙන සේවාය. මූල්‍ය සමාගම්වල සීඝ්‍ර වර්ධනයට හේතුව සමාගම් විසින් සපයන විවිධ සේවාවන් නොවන බව සිසුන්ට පැහැදිලි කර දීමට ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුයි.

4. (i) (අ) ජීවිත රක්ෂණ වන්දියක් හා මෝටර් රථ රක්ෂණ වන්දියක් ලබා ගැනීමට යාමේ දී රක්ෂිතයාට මුහුණදීමට සිදුවිය හැකි ගැටලු **දෙක** බැගින් පැහැදිලි කරන්න.

(ආ) වෘත්තියෙන් වාදකයකු මෙන් ම ගායකයකු ද වන චන්ද්‍රසිරි බොහෝවිට දේශීය සංගීත සංදර්ශනවලට තම මෝටර් රථයෙන් ගමන් කරයි. එසේම ඔහු විදේශ සංගීත සංදර්ශනවලට ද සහභාගී වේ. චන්ද්‍රසිරිට මුහුණපෑමට සිදුවිය හැකි අවදානම් **හතරක්** නම් කර, එම අවදානම් වෙනුවෙන් ඔහුට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු මොනවා දැ'යි සඳහන් කරන්න. (ලකුණු 04 යි)


(ii) අධිවේගී මාර්ග පද්ධති සංවර්ධනය තුළින් ව්‍යාපාර අංශයේ ඇතිවිය හැකි විවිධ වෙනස්කම් මොනවා දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සේවක මණ්ඩලය අමතා දේශනයක් පැවැත්වීමේ දී කළමනාකරුවකු විසින් අවධානයට ලක් කළ යුතු මූලික කරුණු **හතරක්** ලියන්න.

(ආ) පුද්ගලයින් දෙදෙනකු අතර ඇතිවන විද්‍යුත් සන්නිවේදනයේ සඵලදායීත්වය කෙරෙහි බලපෑ හැකි බාධා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) තොග වෙළෙන්දා භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළින් ඉවත් කිරීමට 'පක්ෂ ව' හා 'විපක්ෂ ව' කරුණු **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) කෘෂි රසායනික නිෂ්පාදන ආනයන ක්‍රියාවලියේ පියවර කිහිපයක් පහත සටහනෙහි දැක්වේ.



ඉහත ක්‍රියාවලියෙහි දැක්වෙන **A**, **B**, **C** හා **D** ස්ථාන සඳහා අදාළ පියවර ඔබගේ පිළිතුරු පත්‍රයෙහි දක්වන්න.

(ආ) ණය කාඩ්පත් (Credit cards) මගින් සිදු කරනු ලැබූ ගනුදෙනු පියවීම පහසු කිරීම සඳහා භාවිත කළ හැකි පහසුකම් **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

4. (i) (අ) ජීවිත රක්ෂණය

(1) අනන්‍යතාව ඔප්පු කිරීමට ලියවිලි ඉදිරිපත් කළ යුතුවීම

(2) වන්දි ලබා ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණවීම

(3) පැවරුම් ලාභියා පිළිබඳ ඇතිවන ගැටලු

(4) රෝග විනිශ්චය හා මරණය පිළිබඳ ඇතිවන ගැටලු

(5) අවබෝධයක් නැතිකම

මෝටර්රථ රක්ෂණය

(1) වාහන හිමිකරු හා රක්ෂිතයා දෙදෙනෙකු වන අවස්ථා

(2) ගරාජයෙන් ලබා දෙන ඇස්තමේන්තුව හා රක්ෂණ සමාගමේ ඇස්තමේන්තුව අතර වෙනසක් පැවතීම

(3) වාහනයේ සුන්බුන් නැවත ලබා දීමේදී ඇතිවන ගැටලු

(4) වන්දි ලබා ගැනීමට වැඩි කාලයක් ගතවීම

(5) ඇස්තමේන්තු වන්දියට අවශ්‍ය ක්ෂේත්‍ර රක්ෂණය කර නොතිබීම

(එකකින් ගැටලු දෙකකට ලකුණු 1/2 බැගින් ලකුණු 02 යි)

(ආ)

අවදානම	ඔප්පු
1. ජීවිතයට හානි සිදුවීම	1. ජීවිත රක්ෂණය
2. මෝටර් රථයට අනතුරු සිදුවීම	2. විස්තීරණ රක්ෂණය
3. සංගීත භාණ්ඩ අනතුරට ලක්වීම	3. මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
4. ගාස්තු නොලැබීයාමේ අවදානම	4. මූල්‍ය රක්ෂණය
5. කටහඬ වෙනස්වීම	5. කටහඬ රක්ෂණය
6. වාදනයට භාවිත කරන ශරීර අංග අනතුරට ලක්වීම	6. ශරීරාංග රක්ෂණය
7. ගුවන් අනතුරු	7. විදේශ ගමන් රක්ෂණය

අවදානම් 04 ට ලකුණු 01 යි
අවදානම් 03 හෝ 02 ක් නම් 1/2 යි
ඊට අදාල ඔප්පු 04 කට ලකුණු 01 යි
3 ක් හෝ 02 ක් නම් ලකුණු 1/2 යි

(ii) (1) ව්‍යාපාරවල කාර්යක්‍ෂමතාවය වැඩිවීම. වේගවත් ය./ නාස්තිය අඩුවීම
(2) වෙළෙඳපල සීමාවන් පුලුල්වීම
(3) ගබඩා පිරිවැය අඩුවීම/ ගබඩා අවශ්‍යතා අඩුවීම
(4) අතරමැදියන් සංඛ්‍යාව අඩු නිසා JIT ක්‍රමය අනුගමනය කළ හැකිවීම
(5) සමහර භාණ්ඩ නශ්‍යවීම අවමවීම
(6) විවිධාංගීකරණ වූ ව්‍යාපාර අවස්ථා ඇතිවීම
(7) වෙළෙඳපලේ සම්බන්ධතාවල වෙනස්කම් ඇතිවීම
(කරුණු 04 ක් නම් කිරීමට ලකුණු 02 යි පැහැදිලි කිරීමට ලකුණු 02 යි)

(iii) (අ) (1) සහභාගිවන්නන්ගේ පසුබිම් සාධක
(2) භාෂාව නිවැරදිව හැසිරවීම
(3) නිවැරදි කටහඬ පාලන හා උච්චාරණය
(4) ලබා දෙන පණිවිඩයේ ස්වභාවය පිළිබඳ සැලිකිලිමත්වීම
(5) දේශනය පවත්වන ස්ථානය පිළිබඳව සැලකිලිමත්වීම
(6) දේශනය පවත්වන කාලය පිළිබඳව සැලකිලිමත්වීම
(7) අංගචලනය පිළිබඳව සැලකිලිමත්වීම
(8) අවශ්‍ය පහසුකම් පිළිබඳව සැලකිලිමත්වීම
(9) ප්‍රතිපෝෂණ හැකියාව **(කරුණු 04 ට ලකුණු 02 යි)**

(ආ) (1) සන්නිවේදන උපකරණවල ඇති දුර්වලතා
(2) සන්නිවේදනය ගලායන මාර්ගයේ ඇතිවන බාධා
(3) භාෂා ගැටලු
(4) උපකරණ භාවිත දැනුම පිළිබඳ ඇතිවන බාධා
(5) හැඟීම් හා ප්‍රතිචාර හඳුනාගත නොහැකිවීම
(6) කාලගුණ තත්ත්වයන් **(කරුණු 04 ට ලකුණු 02 යි)**

(iv) පක්ෂව

(1) භාණ්ඩ මිල ගණන් අඩුවීම
(2) ගැණුම්කරු හා විකුණුම්කරු අතර ඍජු සම්බන්ධතාව වැඩිවීම
(3) කෘතිම භාණ්ඩ හිඟ ඇතිවීම වැළැක්වීම
(4) නැවුම් භාණ්ඩ පරිභෝජනය කළ හැකි වීම (එළවළු/පළතුරු)
(5) බෙදා හැරීමේ කාලය අවමවීම
(6) ඒකාධිකාරි බලය මැඩපැවැත්වීම
(7) කාලීන තොරතුරු ලබා දිය හැකිවීම
(8) නිෂ්පාදකයාට හොඳ මිලක් ලබාගැනීමට හැකිවීම
(9) අලෙවි පරිමාව වැඩිවීම.
(10) නිෂ්පාදකයාට නව නිෂ්පාදිත පිළිබඳ පාලනයක් ඇතිවීම

විපක්ෂව

(1) ගබඩා පිරිවැය ඉහළයාම
(2) ප්‍රවාහනය කිරීමේ වාර ගණන වැඩිවීම
(3) නිෂ්පාදකයාගේ කාර්ය සංකීර්ණවීම
(4) ඇතැම් භාණ්ඩ නශ්‍යවීම
(5) තොග වෙළෙඳුන්ගේ විශේෂඥ දැනුම ලබාගත නොහැකිවීම

(පක්ෂව කරුණු 02 කට ලකුණු 02 යි)
(විපක්ෂව කරුණු 02 කට ලකුණු 02 යි)


(v) (අ) (A) මිළ විමසුමක් යැවීම
(B) මිළ කියුමක් ලද පසුව භාණ්ඩ ආනයනය කිරීම පිළිබඳ සුදුසු තීරණයකට එලඹීම
(C) ආනයන බලපත්‍ර ලබාගැනීම
(D) අපනයන කරුට ගෙවීම

(එක පිළිතුරුකට ලකුණු 1/2 බැගින් ලකුණු 02 යි)

(ආ) (1) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM)
(2) වෙළෙඳසල් ගෙවීම්, විද්‍යුත් පැවරුම් ජාල (EFTPOS)
(3) ටෙලි බැංකු පහසුකම්
(4) අන්තර් ජාල බැංකු කටයුතු

(කරුණු 04 ට ලකුණු 02 යි)


4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා:



4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 28%කි. අඩුම ප්‍රතිශතයක් තෝරා ගත් ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 24%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 77%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 8 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (iii) (b) වන අතර එය 50%කි. අඩුම පහසුතාව පෙන්වා ඇත්තේ (v) (a) අනුකොටසට වන අතර එය 20%කි.

4 වන ප්‍රශ්නයෙහි (i) (a) අනුකොටසේ පහසුතාව 23%කි. මෙයට බලපා ඇත්තේ රක්ෂණ වන්දි ලබා ගැනීමේදී රක්ෂිතයාට මුහුණ දීමට සිදුවන ගැටළු පිළිබඳව නිවැරදිව තේරුම් ගෙන නොසිටීමයි. එබැවින් විවිධ රක්ෂණ ඔප්පු සඳහා වන්දි ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ ගවේෂණාත්මකව තොරතුරු සොයා බැලීමට පැවරුම් ලබා දීම තුළින් සිසුන් දැනුවත් කළ යුතුයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී න්‍යායාත්මක දැනුම ලබාදීම මෙන්ම එම දැනුම ප්‍රයෝගිකව භාවිත කෙරෙන ආකාරය පිළිබඳව අවබෝධයක් ලබාදීම ද එකසේ වැදගත් වේ.

(v)(a) අනුකොටසෙහි පහසුතාව 20%ක් වීමට හේතුව වී ඇත්තේ ආනයන ක්‍රියාවලියේ පියවර නිවැරදිව දැක්වීමට සිසුන්ට නොහැකි වීමය. විදේශ වෙළෙඳාමේ ක්‍රියාපිළිවෙත් අනුපිළිවෙළින් පෙළගැස්වීමෙන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම වඩා ඵලදායක වේ.

(v)(b) අනුකොටසෙහි පහසුතාව 22%ක් වීමට හේතුව වූයේ ප්‍රශ්නය නිවැරදිව අවබෝධකර නොගැනීමයි. ණයපත් මගින් සිදුකරනු ලැබූ ගණුදෙනු පියවීම පහසුකිරීම සඳහා භාවිත කළ හැකි පහසුකම් වෙනුවට සිසුන් පිළිතුරු ලෙස දක්වා තිබුණේ ණයපත්ලාභියාට ලැබෙන ප්‍රයෝජනයි. ප්‍රශ්නය හොඳින් අවබෝධ කර ගැනීමේ වැදගත්කම සිසුන්ට පහදාදීම වැදගත් වේ. ණයපතක් නිකුත් කිරීම, ණයපත් භාවිතය, අදාළ පාර්ශව හා ඒ ඒ පාර්ශවයන්ට අත්වන වාසි අවාසි, ණයපතක අඩංගු තොරතුරු, ණයපත් ගණුදෙනු පියවීම, ගණුදෙනු පියවීමේ ක්‍රම හා ඒ ආශ්‍රිත කාලීන ප්‍රවණතා පිළිබඳව ශිෂ්‍යයන් න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව දැනුවත් කළ යුතුයි.

5. (i) කළමනාකරුවකුගේ පහත සඳහන් භූමිකාවලට උදාහරණය බැගින් සපයන්න.

(අ) නායකයා (ආ) තොරතුරු බෙදාහරින්නා

(ඇ) ව්‍යවසායකයා (ඈ) සම්පත් වෙන්කරදෙන්නා (ලකුණු 04 යි)

(ii) "නායකත්වය සංවිධානයක සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වේ." මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) තෝරාගත් බේකරි නිෂ්පාදන කටයුත්තකට අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය එහි එක් එක් අදියරයන් සඳහා උදාහරණ සහිත ව සටහනකින් ඇඳ දක්වන්න. (ලකුණු 04 යි)

(iv) (අ) කුඩා ව්‍යාපාරිකයින් සඳහා දේශනයක් පවත්වන ඔබ සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහයේ වැදගත්කම ඔවුන්ට ඒත්තු ගැන්වීම සඳහා යොදා ගනු ලබන කරුණු **හතරක්** ලියන්න.

(ආ) "ප්‍රමිතීන් නොමැති ව සාර්ථක පාලන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ නොහැකි ය." මෙම ප්‍රකාශය පාලන ක්‍රියාවලිය ඇසුරෙන් තහවුරු කරන්න. (ලකුණු 04 යි)

(v) ලාභාලාභ රහිත ලක්ෂ්‍යයේ දී නිමැවුම් ප්‍රමාණය ඒකක 4 000 කි. විචල්‍ය පිරිවැය ඒකකයට රු. 10 කි.

(අ) ඒකකයක විකුණුම් මිල රු. 15 ක් නම්, මුළු ස්ථාවර පිරිවැය ගණනය කරන්න.

(ආ) රු. 10 000 ක ලාභයක් ලැබීම සඳහා විකිණිය යුතු මුළු ඒකක ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

5. (i)

(අ)	නායකයා	-	සේවක කටයුතු අගය කිරීම, ගුණදොස් දැක්වීම, සේවක උසස් කිරීම් හා ඉවත් කිරීම
(ආ)	තොරතුරු බෙදා හරින්නා	-	රැස්වීම් පැවැත්වීම, ලිඛිත වාර්තා ඉදිරිපත් කිරීම, දුරකථන ඇමතුම් ලබාදීම
(ඇ)	ව්‍යවසායකයා	-	නව ව්‍යාපෘති හඳුන්වාදීම, සංවිධාන ව්‍යුහය වෙනස් කිරීම, නව උපක්‍රම තීරණය
(ඈ)	සම්පත් වෙන්කර දෙන්නා	-	වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම, යටත් නිලධාරීන්ට කාලය වෙන්කර දීම, මූල්‍ය ප්‍රකාශ සැකසීම

(උදාහරණ එකකට ලකුණු 01 බැගින් 04 කට ලකුණු 04 යි)

(ii)
(1) සංවිධානයක දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට සැමගේ දායකත්වය ලබා ගැනීමට
(2) ඉහල කාර්ය සාධනයක් සඳහා සේවකයන් අභිප්‍රේරණයට
(3) විවිධ අංශ අතර සිටින සේවකයින්ගේ කටයුතු සමායෝජනට හා මගපෙන්වීමට
(4) සංවිධානයේ විවිධ අංශ සමග සන්නිවේදනය පවත්වා ගැනීමට
(5) සංවිධානයේ කටයුතු පාලනයට
(6) සහකරුවන්ගේ මානසික ශක්තිය තහවුරු කිරීමට

(ඉහත කරුණු 04 ක් ඇතුළත්ව පැහැදිලි කිරීමට ලකුණු 04 යි)

(iii) යෙදවුම් ⟶ පරිවර්තන ක්‍රියාවලිය ⟶ නිමවුම

(ලකුණු 1/2)

යෙදවුම්		පරිවර්තන ක්‍රියාවලිය		නිමවුම
ගොඩනැගිලි				
ශ්‍රමය				
පාන් පිටි		පාන් පිටි මිශ්‍ර කිරීම		
ඊස්ට්	⟶	බර කිරීම	⟶	පාන්
ජලය		පාන් සැකසීම		
ඉන්ධන		පිලිස්සීම		
උපකරණ				
වෙනත්				
(ලකුණු **$1/2 \times 4 = 02$**)		(ලකුණු **$1/2 \times 2 = 01$**)		(ලකුණු **1/2**)

(iv) (අ) (1) පිරිවැය ලාභය හා පරිමාව පාලනය කිරීමේ උපකරණයක් ලෙස භාවිත කිරීමට

(2) නිෂ්පාදනය සැලසුම් කිරීමට

(3) නිෂ්පාදිත සඳහා මිල නියම කිරීමට

(4) ව්‍යාපාර ආදායම, පිරිවැය, මිල යන අංශවල වෙනස් වීම් විග්‍රහ කිරීමට

(5) නිමැවුමේ හා අලෙවියේ විවිධ මට්ටම් වලදී ලාභය හෝ අලාභය පෙන්නුම් කිරීමට

(6) ව්‍යාපාර ආරම්භය හා වර්ධනය කිරීමේ තීරණ ගැනීමට

(7) ව්‍යාපාර සාර්ථකත්වය පිළිබඳ ඒත්තු ගැන්වීමට

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04 කට ලකුණු 02 යි)

(ආ) සැලසුම් කරණ ලද දෑ ඒ අයුරින්ම ඉටු වී දැයි සොයා බැලීමත් විචලනයන් වේ නම් නිවැරදි කිරීමත් පාලනය වේ. ප්‍රමිත ස්ථාපිත කිරීම සිදුවන්නේ සැලසුම් කරණයේ දීමය, විචලනයන් හඳුනාගැනීමත් ඒවා නිවැරදි කිරීමත් ඇතුලු පාලන ක්‍රියාවලියේ සෑම අදියරයකදීම ප්‍රමිත අවශ්‍යවේ. එහෙයින් ප්‍රමිතීන් නොමැතිව පාලන ක්‍රියාවලිය සිදුකල නොහැකිය.

(පාලන ක්‍රියාවලියේ සෑම අදියරයකට ප්‍රමිත සම්බන්ධ වන බව දැක්වෙන සාර්ථක පිළිතුරකට ලකුණු 02 යි)

(v) (අ) සමච්ඡේදන ලක්ෂ්‍යය $= \dfrac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකකයක දායකය}}$

ඒකක 4000 $= \dfrac{X}{5}$

$$X = 5 \times 4000 = 20000$$

$\therefore$ ස්ථාවර පිරිවැය $= 20000$

(ගණනය කරන ආකාරයට ලකුණු 01 පිළිතුරට ලකුණු 01)


(ආ) විකිණිය යුතු විකුණුම් ඒකක $= \dfrac{20000 + 10000}{5}$

$$= \frac{30000}{5}$$

$$= 6000$$

(ගණනය කරන ආකාරයට ලකුණු 01 යි. පිළිතුරු 01 යි)


5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 78%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 37%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 62%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයේ අනුකොටස් 10ක් ඇති අතර (i) (d) අනුකොටසට අඩුම පහසුතාවක් දක්වන අතර එය 30%කි. වැඩිම පහසුතාවක් දක්වන්නේ (v)(a) අනුකොටසට වන අතර එය 67%කි.

(i) (d) අනුකොටසෙහි පහසුතාව 30%කි. මෙයට හේතුව කළමනාකරුවකුගේ භූමිකාවලට අදාළ නිදසුන් නිවැරදිව ඉදිරිපත් කිරීමට සිසුන්ට නොහැකි වීමය. කළමනාකරුවකුගේ භූමිකාවලට අදාළ නිදසුන් වෙන් කර ඉදිරිපත් කිරීමට සිසුන්ට මඟ පෙන්වීම වැදගත් වේ. මේ සඳහා පැවරුම් හා සිද්ධි අධ්‍යයන ක්‍රියාකාරකම් තුළින් සිසුන්ගේ අවබෝධය තහවුරු කළ හැකිය. කළමනාකරණ භූමිකාවල අර්ථ නිරූපනයන් හා ඒවායේ සුවිශේෂී වෙනස්කම් නිර්වචනයන් ආශ්‍රයෙන් පැහැදිලි කිරීම ද වැදගත් වේ.

(iv) (a) අනුකොටසෙහි පහසුතාව 35% වීමට හේතුව වී ඇත්තේ සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහයේ ගණනය කිරීම් පිළිබඳව සිසුන් තුළ දැනුම නොමැති බවය. එම නිසා සමච්ඡේද ලක්ෂ විග්‍රහයේ වැදගත්කම් සැලකිල්ලට ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

6. (i) (අ) සෑම වෙළෙඳපොළ ඛණ්ඩනයක් ම සඵලදායී නො වේ. සඵලදායී වෙළෙඳපොළ ඛණ්ඩනයක් සඳහා පැවතිය යුතු අවශ්‍යතා විස්තර කරන්න.

(ආ) නිමල් සාමාන්‍ය බස් රථ පහක් යොදාගෙන මගී ප්‍රවාහන සේවාවක් පවත්වා ගෙන යනු ලැබේ. පාරිභෝගික තෘප්තිය තවදුරටත් වර්ධනය කිරීම සඳහා නිමල් විසින් ඔහුගේ ප්‍රවාහන සේවාවට එකතු කළ යුතු අතිරේක පහසුකම් පිළිබඳ ව ඔබ විසින් ඔහුට ලබා දෙන යෝජනා මොනවා ද? (ලකුණු 04 යි)

(ii) (අ) ප්‍රාථමික ඇසුරුම් හා ද්විතීයික ඇසුරුම් යනු කුමක් දැ'යි විස්තර කරන්න.

(ආ) ඇසුරුම්කරණය තුළින් ව්‍යාපාරිකයකුට ලැබෙන වාසි **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) මූල්‍යන තීරණ හා ආයෝජන තීරණ යනු මොනවා දැ'යි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) යසපාල මිරිස් තුනපහ කුඩුකර, පැකට් කර බෙදා හැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටියි. ඔහුගේ දිගුකාලීන හා කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා උදාහරණ **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'සංචිත ප්‍රාග්ධනීකරණය' යනුවෙන් හඳුන්වන්නේ කුමක් දැ'යි විස්තර කරන්න.

(ආ) පරිසර දූෂණය අවම කිරීම සඳහා නිෂ්පාදන ආයතනයකට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

6. (i) (අ) (1) මැනිය හැකිබව
(2) ප්‍රමාණවත් බව
(3) ළඟා විය හැකිබව
(4) වෙන් කොට හඳුනාගත හැකිබව
(5) ක්‍රියාත්මක කළහැකිබව

(අවශ්‍යතා 02 ක් නම් කිරීමට ලකුණු 01 යි. විස්තර කිරීමට ලකුණු 01 යි)

(ආ) (1) නියමිත වේලාවට පැමිණීම හා ගමන අවසන් කිරීම
(2) රියදුරු හා රියදුරු සහායකගේ ආචාරශීලී හැසිරීම
(3) ගණුදෙනු නිසි පරිදි සිදුකිරීම
(4) බස් රථය වායු සමීකරණය කිරීම
(5) රූපවාහිනී පහසුකම් සැපයීම
(6) ආරක්ෂිත කැමරා පද්ධති සවිකිරීම
(7) පානීය ජලය ලබා ගැනීමට ජල පෙරන පහසුකම (Filter)
(8) දුරකථන චාජ් කිරීමේ පහසුකම්
(9) කාඩ්පත් මගින් ගෙවීම් කිරීමේ පහසුකම
(10) ස්වයංක්‍රියව දිස්වන නාමපුවරු සවිකිරීම
(11) ප්‍රථමාධාර පහසුකම්/ පිරිසිදුකම
(12) මගීන්ගේ ආරක්ෂාව තහවුරුවීම **(කරුණු 04 ට ලකුණු 02)**

(ii) (අ) ප්‍රාථමික ඇසුරුම
නිෂ්පාදිතයක ආරක්ෂාව සැලසෙන අයුරින් නිෂ්පාදිතයට සමීපතවම පවතින ඇසුරුමයි. මෙය අත්‍යවශ්‍ය ඇසුරුමයි. භාණ්ඩයේ හැඩය, ස්වභාවය අනුව ඇසුරුම වෙනස් වේ.

ද්විතීයික ඇසුරුම
ප්‍රාථමික ඇසුරුමට පිටතින් ඇති වෙනත් ඇසුරුමයි. මෙය අත්‍යවශ්‍ය නොවේ. මෙය ප්‍රවර්ධන උපක්‍රමයක් ලෙස භාවිතා කරයි. තොරතුරු සපයයි.

(විස්තර කිරීම් එකකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

(ආ) (1) නිෂ්පාදිතයට ආරක්ෂාවක් ලැබීම
(2) නිෂ්පාදිතය හඳුනා ගැනීමට පහසුවීම
(3) නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු සැපයීම

(4) ප්‍රවර්ධනය උපකරණයක් ලෙස භාවිතා කළ හැකිවීම

(5) නිෂ්පාදිතයට ආකර්ෂණීය පෙනුමක් ලබාදීම

(6) ගබඩාකරණයට, ප්‍රවර්ධනයට හා ප්‍රවාහනයට පහසුවීම

(වාසි 02 ක් නම්කර පැහැදිලි කිරීමට ලකුණු 02)

(iii) (අ) (1) අයිතිකරුවන්ගේ ධනය උපරිම කිරීම

(2) ලාභය උපරිම කිරීම

(3) කොටසක ඉපයුම් උපරිම කිරීම

(4) මූල්‍ය සම්පත් සැලසුම් කිරීම

(5) මූල්‍ය සම්පත් පාලනය කිරීම

(6) ද්‍රවශීලතා ගැටලු කළමනාකරණය කිරීම

(7) මූල්‍යයන හා ආයෝජන තීරණ ගැනීම **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ) මූල්‍යයන තීරණ

ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයාගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණයයි. උදා: කොටස්, ණයකර, ණය

ආයෝජන තීරණ

අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම්වල ආයෝජනය පිළිබඳව ගනු ලබන තීරණයි.
උදා: යන්ත්‍ර, උපකරණ, ඉඩම්, ගොඩනැගිලි, වෙළෙඳ තොග ආදිය මිලට ගැනීම

(ඉරි ඇඳි අදහස ඇතුළත් පිළිතුරකට කරුණු 02 කට ලකුණු 02 යි)

(iv) (අ) දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා

(1) ඉඩම් හා ගොඩනැගිලි මිලදීගැනීම

(2) මිරිස් ඇඹරුම් යන්ත්‍ර මිලදීගැනීම

(3) බෙදාහැරීමේ රථවාහන මිලදීගැනීම

(4) කාර්යාලයීය උපකරණ මිලදීගැනීම

(5) අත්හදා බැලීම් වෙළෙඳපොළ පර්යේෂණ සඳහා

(උදාහරණ 02 කට ලකුණු 02 යි)

කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා

(1) මිරිස් තුනපහ ආදිය මිලටගැනීම

(2) ඇසුරුම් ද්‍රව්‍ය මිලටගැනීම

(3) සේවක වැටුප් ගෙවීම

(4) දුරකථන, විදුලි ගාස්තු ගෙවීම

(5) බෙදා හැරීමේ පිරිවැය **(උදාහරණ 02 කට ලකුණු 02 යි)**


(v) (අ) සංචිත ප්‍රාග්ධනීකරණය

(1) මෙහිදී සමාගම සතුව **පවතින සංචිත**, කොටස් ප්‍රාග්ධනය බවට පත් කිරීම සිදුවේ. මේ අනුව **දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට** යම් අනුපාතයකට අනුව නව කොටස් ලැබීමත් සිදුවේ. සංචිත ප්‍රාග්ධනීකරණයේ දී **සමාගමේ ප්‍රකාශකල ප්‍රාග්ධනයේ** වැඩි වීමක් සිදුවේ.

(ඉරි ඇඳි කරුණු ඇතුළත් පිළිතුරකට ලකුණු 02)

(ආ) (1) විකල්ප පරිසරය හිතකාමී අමුද්‍රව්‍ය භාවිත කිරීම
(2) භාවිත කරන ද්‍රව්‍ය නැවත ජනනය කිරීමට කටයුතු කිරීම
(3) පරිසර හිතකාමී ඇසුරුම් භාවිතය
(4) පරිසර හිතකාමී හරිත නිෂ්පාදනවලට යොමුවීම
(5) අපතේ යන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම
(6) කර්මාන්තශාලාවලින් පිටවන ශබ්ද හා දුම් පාලනයට අදාළ උපකරණ භාවිතය
(7) අපද්‍රව්‍ය ජලය විධිමත්ව බැහැර කිරීම
(8) පරිසර දූෂණය අවම කිරීමට ක්‍රියා කරන ආයතනවල සහාය ලබාගැනීම
(9) සේවකයින් හා පාරිභෝගිකයින් දැනුවත් කිරීම


6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



6 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 74%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 13%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 45%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 55%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයේ අනුකොටස් 9ක් ඇති අතර (v) (a) අනුකොටසෙහි අඩුම පහසුතාවක් දක්වන අතර එය 27% කි. අතුරෙන් පහසුතාව වැඩිම කොටස (ii) (b) වන අතර එය 79%කි.

හයවන ප්‍රශ්නයෙහි (i) (a) හි අනුකොටසෙහි පහසුතාව 30%කි. එයට හේතුව සඵලදායි වෙළෙඳපොළ ඛණ්ඩනයක් සඳහා පැවතිය යුතු අවශ්‍යතා සිසුන් විසින් හඳුනා නොගැනීමයි. එසේම අවශ්‍යතා නම් කර තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ පිළිබඳව කෙටි විස්තරයක් ද පිළිතුරෙහි අඩංගුවන පරිදි පිළිතුරු ලිවීමට සිසුන් හුරු කළ යුතුයි.

(iii) (b) හි පහසුතාව 39% වීමට හේතුව මූල්‍ය කළමනාකරණයේ මූලික තීරණ පිළිබඳව අවබෝධයකින් තොරව පිළිතුරු සැපයීමය. මූල්‍යයන තීරණ හා ආයෝජන තීරණ නිදසුන් සහිතව ලියා දැක්වීමට පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුයි.

(v) (a) හි පහසුතාව 27%ක් ලෙසට පහළ යාමට බලපා ඇත්තේ සංචිත ප්‍රාග්ධනීකරණය යන්න නිවැරදිව හා නිශ්චිතව ඉදිරිපත් කිරීමට සිසුන් අපොහොසත් වීමය. ඒ නිසා යම් සමාගමක් සතුව පවතින සංචිත, කොටස් ප්‍රාග්ධනය බවට පරිවර්තනය වීම පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුයි. මූල්‍ය කළමනාකරණයේ න්‍යායාත්මක කරුණු පිළිබඳව වැඩි අවධානය යොමු විය යුතුය.

7. (i) රටක මූල්‍ය පද්ධතියේ සංයුතියට අඩංගු වන කොටස් **හතරක්** උදාහරණ සහිත ව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි පාර්ශ්වකරුවන් **හතරක්** නම් කරන්න.

(ආ) භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමෙන් ගැනුම්කරුට ලබාගත හැකි වාසි මොනවා ද? (ලකුණු 04 යි)

(iii) කමල් සහ සරත් අලෙවි නියෝජිත තනතුරක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වූහ. කමල් අධ්‍යාපනය ලබා ඇත්තේ 8 ශ්‍රේණිය දක්වා පමණකි. සරත් උසස් පෙළ විභාගය සමත් වී සිටි නමුදු සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ තනතුර සඳහා කමල් තෝරාගන්නා ලදී. මෙහිදී කමල් ව තෝරා ගැනීම සඳහා බලපාන්නට ඇති කරුණු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) මානව සම්පත් කළමනාකරණ කාර්යයන් දෙකක් මත පදනම් වී ඇති පහත වගුවෙහි අදාළ ස්ථානයන් සඳහා එක් කරුණ බැගින් සඳහන් කරමින් සම්පූර්ණ කරන්න. (පිළිතුර සඳහා පහත දැක්වෙන ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

කාර්යයන් / පාර්ශ්වයන්	කාර්යඵල ඇගයීම		පුහුණුව හා සංවර්ධනය	
	වාසි	අවාසි	වාසි	අවාසි
සංවිධානයට				
සේවකයින්ට				

(ලකුණු 04 යි)

(v) යහපත් සේව්‍ය-සේවක සම්බන්ධතා පවත්වා ගැනීමෙන් ආයතනයකට ලබාගත හැකි වාසි **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

ක්‍රියා මාර්ග 04 කට ලකුණු 02

7. (i)
(1) මූල්‍ය ආයතන උදා: වාණිජ බැංකු, විශේෂිත බැංකු
(2) මූල්‍ය උපකරණ උදා: සාමාන්‍ය කොටස් ණයකර, භාණ්ඩාගර බිල්පත්
(3) මූල්‍ය යටිතල පහසුකම් උදා: RTGS, SSSS
(4) මූල්‍ය වෙළෙඳපොල උදා: මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ
(5) මධ්‍යම බැංකුව උදා: ශ්‍රී ලංකා මහ බැංකුව
(6) නියාමන උදා: සුරැකුම්පත් හා විනිමය කොමිසම
(7) ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය

(එක් නම් කිරීමකට 1/2 බැගින් හතරකට ලකුණු 02)

(උදාහරණයකට 1/2 බැගින් හතරකට ලකුණු 02)

(ii) (අ)
(1) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
(2) සීමා සහිත ව්‍යාපාර වස්තු හුවමාරු සමාගම
(3) භාරකාර බැංකුව
(4) ලැයිස්තුගත සමාගම්
(5) ආයෝජකයින්
(6) මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS)
(7) තැරැව්කාර සමාගම
(8) මුදල් අමාත්‍යාංශය (එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04 කට ලකුණු 02)

(ආ)
(1) ඉහළ හා ස්ථාවර ප්‍රතිලාභ ලැබීම
(2) රජයේ ආරක්ෂාව ලැබීම
(3) අවදානම අඩුවීම
(4) කල් පිරීමට පෙර වට්ටම් කරගත හැකිවීම
(5) ඉහළ ද්‍රවශීලතාවය

(6) බදු සහන

(7) ආයෝජන අවස්ථාවේදී ප්‍රතිලාභ ලැබීම

(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04 කට ලකුණු 02)

(ii) (ආ) (1) සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් ආකාරය

(2) ආයතනය පිළිබඳව ඇති දැනුම

(3) ප්‍රියමනාප හා ප්‍රසන්න පෙනුම

(4) සමාජශීලීබව

(5) තනතුරට අදාල පෞරුෂත්වය

(6) අදාළ ක්ෂේත්‍රය පිළිබඳව අත්දැකීම් සහිතබව

(7) සන්නිවේදන හැකියාව

(8) ක්ෂේත්‍රය පිළිබඳව ඇති විශේෂඥ දැනුම

(9) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ පක්ෂපාතී/අපක්ෂපාතීබව

(10) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ආකල්ප

(11) රැකියාවට අදාළ ආකල්ප

(12) රැකියාවට අවශ්‍ය කුසලතා

(13) නිර්දේශිත වාර්තා වාසි සහගතවීම

(පැහැදිලි කිරීම් සහිත එක් කරුණකට ලකුණු 01 බැගින් හතරකට ලකුණු 04)

(පැහැදිලි කිරීම් නොමැති නම් එක් කරුණකට ලකුණු 1/2 බැගින් හතරකට ලකුණු 02)

(iv) කාර්යඵල ඇගයීම් වාසි

සංවිධානයට

(1) පුහුණු කිරීමේ අවශ්‍යතාව හඳුනාගැනීම

(2) උසස් කිරීම මාරු කිරීම් තීරණයට

(3) විනයානුකූලව කටයුතු කිරීමට

(4) වැටුප් වර්ධක හඳුනා ගැනීමට

(5) පැවරූ කාර්යයන්/ අරමුණු ඉටුවී ඇත්දැයි දැනගැනීමට හැකිවීම.

(6) සේවක කාර්යඵල වැඩිවීම නිසා ආයතනයේ ඵලදායිතාව වැඩිවීම

(කරුණකට ලකුණු 1/2)

සේවකයාට

(1) සේවක ඵලදාව ඉහළයාම

(2) සේවක අභිප්‍රේරණය ඇතිවීම

(3) පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම

(4) ස්වයං තක්සේරුවක් ලැබීම

(5) රැකියා සුරක්ෂිතබව තහවුරු කිරීමට

(6) සේවකයාට උසස්වීම් ලබාගැනීමට **(කරුණකට ලකුණු 1/2)**

අවාසි

සංවිධානයට - කාර්යඵල අඩු සේවක අතෘප්තිය නිසා නිෂ්පාදන ඵලදායීතාව අඩුවීම, කාලය හා පිරිවැය ඇරීමට සිදුවීම **(කරුණකට ලකුණු 1/2)**

සේවකයාට - ඇගයීම් ක්‍රමය මත දක්ෂතා යටපත් වීම, කාර්යඵල අඩු සේවකයන් තුළ අතෘප්තියක් ඇතිවීම, සේවක තරගකාරිත්වය ඇතිවීම මත ඇතිවන ගැටුම් **(කරුණකට ලකුණු 1/2)**

පුහුණුව හා සංවර්ධනය

වාසි

සංවිධානයට - 1. නිමැවුමේ ගුණාත්මක බව ඉහළයාම
2. සේවක වැරදි අවමවීම
3. සේවක කාර්ය සාධනය වර්ධනය වේ.
4. මානව නිපුණතා දර්ශකය ඉහළයාම
5. සුපරීක්ෂණය පහසුවීම (කරුණකට ලකුණු 1/2)

සේවකයාට - 1. සේවක තෘප්තිය වැඩිවීම
2. උසස්වීම් ලබා ගැනීමට ඉඩකඩ ඇතිවීම
3. කාර්යසාධනය ඉහළයාම
4. සේවක දැනුම යාවත්කාලීනවීම (කරුණකට ලකුණු 1/2)


අවාසි

සංවිධානයට - 1. ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම
2. කාලය හා සම්පත් අපතේයාම (කරුණකට ලකුණු 1/2)

සේවකයාට - 1. කාලයක් වැයකළ යුතුවීම
2. සේවකයාට පුහුණුව අදාළ නොවුවහොත් ඇතිවන අතෘප්තිය
(කරුණකට ලකුණු 1/2)

(v) (1) ආයතනයේ සේවක ඵලදායිතාව ඉහළයාම
(2) කාර්මික ආරවුල් අඩුවීම
(3) සම්පත් නාස්තිය අඩුවීම
(4) සේවක ප්‍රවාසිතාව අඩුවීම
(5) අභිප්‍රේරණය වූ සේවක කණ්ඩායමක් බිහිවීම
(6) සේවක පිරිවැටුම අඩුවීම
(7) කීර්තිනාමය ඉහළයාම
(8) සේවක දුක්ගැනවිලි අඩුවීම


7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



7 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 31%කි. (ප්‍රස්තාරය 02) II කොටසින් අඩුම සිසු පිරිසක් තෝරාගෙන ඇති ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 16%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 44%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 56%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 06 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (v) අනුකොටස වන අතර එය 66%කි. අඩුම පහසුතාව 30% ලබාගෙන ඇත්තේ (i) අනුකොටස සඳහා වේ.

(i) අනුකොටසෙහි පහසුතාව 30%කි. මෙසේ අඩුවීමට බලපා ඇති හේතුව වන්නේ රටක මූල්‍ය පද්ධතියේ සංයුතියට අයත් කොටස් නිදසුන් සහිතව ඉදිරිපත් කිරීමට නොහැකි වීමය. සිසුන්ට වඩාත් සුදුසු ඉගෙනුම් ආධාරක භාවිතයෙන් පන්ති කාමරය තුළදී මෙන්ම බාහිරව ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය. පුවත්පත් සඟරා ආශ්‍රයෙන්ද මූල්‍ය පද්ධතියේ සංයුතිය පිළිබඳව දැනුවත් කර කරුණු සොයා බැලීමට, ගවේෂණයට සිසුන්ට මඟ පෙන්විය යුතුය.

නිදසුන් සහිතව විස්තර කළ යුතු අවස්ථාවකදී නම් කර දැක්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. විස්තර කිරීම් පැහැදිලි කිරීම් කළ යුතු අවස්ථාවල ප්‍රමාණවත් පරිදි පැහැදිලිකිරීම් ඇතුළත් පිළිතුරු සැපයීමට සිසුන්ට මඟ පෙන්වීම ඉතා වැදගත් වේ.

8. (i) (අ) ව්‍යාපාර සඳහා දැනුම් ආර්ථිකය ප්‍රයෝජනවත් වන ආකාර **හතරක්** පැහැදිලි කරන්න.

(ආ) "තොරතුරු, දත්තවලට වඩා ප්‍රයෝජනවත් ය." මෙම ප්‍රකාශය දත්ත සහ තොරතුරු සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) තොරතුරු පද්ධතින්ගේ භාවිත ස්වභාවය පහත වගුව මගින් දැක්වේ. (①, ②, ③, ④, ⑤, ⑥, ⑦ හා ⑧ යන ස්ථානවලට අදාළ පිළිතුරු පමණක් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.)

සංවිධාන මට්ටම	**තොරතුරු පද්ධති**	**අවශ්‍ය වන්නේ කුමක් සඳහා ද**	**උදාහරණ**
මෙහෙයුම්	..........①..........	දෛනික කටයුතු	..........②..........
දැනුම්	කාර්යාල ස්වයංකරණ	..........③..........	..........④..........
..........⑤..........	කළමනාකරණ	සැලසුම් හා පාලන	..........⑥..........
උපායශීලී	..........⑦..........	..........⑧..........	ආයෝජන ඇගයීම්

(ලකුණු 04 යි)

(iii) (අ) අලෙවි සැලැස්මක අඩංගුවන 'තරගකාරිත්ව විශ්ලේෂණය' යටතේ සැලකිල්ලට ගත යුතු තොරතුරු අයිතමයන් **හතරක්** සඳහන් කරන්න.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක ඇතුළත් වන මුදල් ගලා ඒම්වලට නිදසුන් **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'පද්ධති මෘදුකාංග' හා 'යෙදවුම් මෘදුකාංග' අතර වෙනස විස්තර කරන්න.

(ආ) 'බස්ජාල' හා 'තාරකාජාල' විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශනයක දැක්වෙන ශුද්ධ විකුණුම් ගණනය කරන ආකාරය පෙන්වන්න.

(ආ) එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා අරමුදල් අවශ්‍ය වන ප්‍රධාන පිරිවැය අයිතම **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) (1) තොරතුරු බහුලවීම
(2) වඩා නිවැරදි තීරණගත හැකිවීම
(3) ආයතන අතර, දැනුම හුවමාරු කරගත හැකිවීම
(4) අලුත් ව්‍යාපාර හා ව්‍යාපාර උපක්‍රම බිහිවීම
(5) ව්‍යාපාර අවශ්‍යතා පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවීම
(6) ව්‍යාපාර කටයුතුවලදී දෝෂ අවමවීම
(7) ව්‍යාපාර සන්නිවේදන ක්‍රියාවලිය පහසුවීම
(8) තරගකාරිත්වයට මුහුණ දිය හැකිවීම
(9) අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රසාරණයවීම
(10) පිරිවැය අවමවීම
(11) ගෝලීයකරණ ප්‍රතිලාභ ලැබීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 04 කට ලකුණු 04 යි)

දත්ත	තොරතුරු
1. දත්ත මත තීරණගත නොහැකිය	1. තීරණ ගැනීමට යොදාගත හැකිය.
2. දත්ත සැකසුම් ක්‍රියාවලියට ආදානය කරන මූලික දේ දත්ත වේ.	2. දත්ත සැකසීමේ ක්‍රියාවලින් බිහිවන ප්‍රතිදානය තොරතුරු වේ.
3. දත්ත වශයෙන් පවතින විට වටිනාකමක් නැත.	3. තොරතුරුවල වටිනාකමක් ඇත.
4. අමුද්‍රව්‍යයකි.	4. නිමි ද්‍රව්‍යයකි.
5. තේරුම් ගත නොහැකිය.	5. තේරුම් ගත හැකිය.

(සංසන්දනය කරමින් සපයන පිළිතුරකට ලකුණු 02)

(සැසඳීමට පමණක් නම් පිළිතුරකට ලකුණු 01)

(ii) (1) ගනුදෙනු සැකසුම් පද්ධති TPS

(2) විකුණුම් වාර්තා/ සේවක පැමිණීම/ වැටුප් වාර්තා

(3) තොරතුරු බෙදාහැරීම හා පරිභෝජනය

(4) වදන් සැකසුම/ විද්‍යුත් තැපැල් පහසුකම්

(5) කළමණාකරණ

(6) කාලීන වාර්තා/විශේෂ වාර්තා/ අයවැය

(7) විධායක උපකාරක පද්ධති

(8) උපාය මාර්ගික තීරණ ගැනීමට **(1/2 බැගින් ලකුණු 04)**

(iii) (අ) (1) පවත්නා තරගකාරීත්වය

(2) තරගකරුවන් හා ඔවුනගේ ශක්තීන්

(3) තරගයට මුහුණ දීමට තමා සතු ශක්තීන් හා දුර්වලතා

(4) වෙළෙඳපලට පිවිසිමට ඇති බාධා

(5) තරගකරුවන්ගේ උපාය මාර්ග **(කරුණු 04 ට ලකුණු 02)**

(ආ) (1) අත්පිට විකුණුම්

(2) ණයගැති ලැබීම්

(3) අතිරික්ත වත්කම් විකිණීම

(4) කොටස් නිකුත් කිරීම

(5) බැංකු ණය ලබාගැනීම **(කරුණු 04 ට ලකුණු 02)**

(iv) (අ) (1) පරිගණක පද්ධතියක් තුල සියලුම උපකරණ හෝ කොටස් හැසිරවීම සඳහා යොදා ගනු ලබන පරිගණක ක්‍රම පද්ධති මෘදුකාංග වේ.
උදා: Windos / Vista **(ලකුණු 01)**

යෙදවුම් මෘදුකාංග යනු පරිගණක පද්ධතියක දත්ත සැකසීමේ ක්‍රියාවලිය පාලනය සඳහා උපයෝගී කරගන්න මෘදුකාංග වේ. උදා: වදන් සැකසුම්, පැතුරුම්පත්) **(ලකුණු 01)**

(ආ) බස් ජාල
සියලු පරිගණක පොදු පරිපථයට සම්බන්ධ වන සේ ස්ථානගත කර ඇති ජාලය බස් ජාලයයි. ජාලයට සම්බන්ධ එක් පරිගණකයක් ක්‍රියාවිරහිත වුවද සමස්ථ පද්ධතිය අක්‍රීය නොවේ. ප්‍රධාන කේබලය අක්‍රීය වූ විට සියලුම පරිගණක අක්‍රීය වේ. **(ලකුණු 01)**

තාරකා ජාල
එක් මධ්‍ය පරිගණකයට සෙසු පරිගණක සම්බන්ධ කොට සැදුම්ලත් ජාලයකි. මධ්‍ය පරිගණකය ක්‍රියාවිරහිත වුවහොත් අනෙක් පරිගණක සමග තොරතුරු හුවමාරු කරගත නොහැකිය. **(ලකුණු 01)**

(v) (අ)

විකුණුම් ආදායම	xxxx
අඩුකලා : ආපසු එවුම්	(xxx)
දළ විකුණුම් ආදායම	xxx
පිරිවැටුම් බදු (vat)	(xxx)
ශුද්ධ විකුණුම්	xxxx

හෝ


දළ විකුණුම් ආදායම	xxxx
අඩුකලා : පිරිවැටුම් බදු (vat)	(xxx)
ශුද්ධ විකුණුම්	xxx

(ලකුණු 01)

(ඇ) අමුද්‍රව්‍ය මිලදී ගැනීම
ණය වාරික ගෙවීම
විදුලිය
වැටුප් හා වේතන
ගෙවල් කුලී
දුරකථන ගාස්තු
පරිපාලන වියදම්
ප්‍රවාහන වියදම් **(කරුණු 04 ට 1/2 බැගින් ලකුණු 02)**

8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




8 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 27%කි. (ප්‍රස්තාරය 02) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. II වන කොටසින් අඩුම සිසුන් පිරිසක් තෝරාගෙන ඇති ප්‍රශ්නය මෙයයි.

ඉන් ලකුණු	00 - 05	ප්‍රාන්තරයේ	37%ක් ද,
ලකුණු	06 - 10	ප්‍රාන්තරයේ	41%ක් ද,
ලකුණු	11 - 15	ප්‍රාන්තරයේ	18%ක් ද,
ලකුණු	16 - 20	ප්‍රාන්තරයේ	4%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 22%ක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 78%ක්ම ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.

8 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව



8 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 09 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (i) (b) වන අතර එය 71%කි. අඩුම පහසුතාව 10% ලබාගෙන ඇත්තේ (v) (a) කොටස සඳහා ය.


(i) (a) අනුකොටසෙහි පහසුතාව 32%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව ව්‍යාපාර සඳහා දැනුම් ආර්ථිකය වැදගත් වන ආකාර පිළිබඳව නිවැරදිව පැහැදිලිකර නොතිබීමයි. දැනුම් ආර්ථිකය හා තොරතුරු ආර්ථිකය අතර සම්බන්ධතාවය අවබෝධ කර නොගැනීම මෙයට හේතුව වී ඇත. තොරතුරු ආර්ථිකයක පදනම, දැනුම බව සිසුන්ට අවබෝධ කරලීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ.

(ii) අනුකොටසෙහි පහසුතාව 29% වී ඇත්තේ තොරතුරු පද්ධතියේ මට්ටම්, පද්ධති, කටයුතු හා නිදසුන් වශයෙන් සවිස්තරාත්මක පැහැදිලි කිරීමට සිසුන් අපොහොසත් වීමය. පන්ති කාමරය තුළදී ඉගෙනුම් ආධාරක භාවිතයෙන්, ප්‍රායෝගික තත්ත්වයන් උපයෝගි කරගෙන ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කර ගැනීමෙන් මේ පිළිබඳව සිසුන්ට අවබෝධ කර දිය හැකිය. එමෙන්ම පරිගණක විද්‍යාගාර තුළින් ද මේ පිළිබඳව න්‍යායාත්මක දැනුම හා භාවිතය තුළින් වැඩි අවබෝධයක් ලබා දිය හැකිය.

(iii) (a) අනුකොටසෙහි පහසුතාව 24%කි. මෙසේ වීමට බලපා ඇත්තේ අලෙවි සැලැස්මක අඩංගු කරුණු අනුකොටස් වශයෙන් නිවැරදිව ඉදිරිපත් කිරීමට නොහැකි වීමයි. එම නිසා පන්ති කාමරය තුළ ප්‍රායෝගිකව ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම තුළින් සිසුන්ගේ දැනුම හා අවබෝධය වර්ධනය කළ හැකිවේ.

(v) (a) හි අනුකොටසෙහි පහසුතාව 10%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුවී ඇත්තේ ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශනයක ශුද්ධ විකුණුම් ගණනය කිරීමට සිසුන්ට නොහැකිවීමයි. මේ ආශ්‍රිත ගැටළු හා අභ්‍යාස පන්ති කාමරය තුළ ප්‍රගුණ කිරීම වැදගත් ය.

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ථ නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



I කොටසේ ප්‍රශ්න හතරින් වැඩිම පිරිසක් (100%) ක් තෝරා ඇති ප්‍රශ්නය පළමු ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 61%ක් පමණ වේ. මෙම කොටසේ ප්‍රශ්න හතර අතරින් අඩුම පිරිසක් (29%) තෝරා ඇත්තේ 4 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව ද (35%) අනෙක් ප්‍රශ්නවලට වඩා අඩුය.

II කොටසේ ප්‍රශ්න හතර අතුරින් වැඩිම පිරිසක් (79%) තෝරා ඇත්තේ 5 වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 49%කි. මෙම කොටසේ අඩුම පිරිසක් තෝරා ඇත්තේ 8 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාවය 39% ක් පමණ වේ.

III කොටස

3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්ය වේ ද කොපමණ ලකුණු ලැබේ ද කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර, ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන පිළිතුරු ලිවිය යුතුය.

- ★ I පත්‍රයේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය දෙකයි.

- ★ II පත්‍රයේ I හා II උප කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන මුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය තුනයි.

- ★ සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

- ★ ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදිව සඳහන් කළ යුතුය.

- ★ සියලුම ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවිය යුතුය. ප්‍රශ්න යටතේ දී ඇති තොරතුරුත්, ලබා ගත යුතු පිළිතුරු හෝ සාධනය කළ යුතු ප්‍රතිඵල කවරේ ද යන්නත් පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.

- ★ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතුය.

- ★ පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු ලිවීමේදී නිල් පාට හෝ කළු පාට පෑන් පමණක් භාවිත කළ යුතුය. අනෙකුත් පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

විශේෂ උපදෙස් :

- * ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා බහුවරණ ප්‍රශ්න සඳහා නියමිත ස්ථානයේ නිවැරදි වරණයේ අංකය පැනකින් සටහන් කළ යුතු යි.

- * ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ හිස්තැනෙහි සුදුසු වචන ලියා හිස්තැන් පිරවිය යුතු යි.

- * ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු අදාළ ස්ථානයේ ලිවීම කළ යුතු යි.

- * ඒ ඒ ප්‍රශ්නය යටතේ ප්‍රශ්න අනු කොටස් සියල්ලටම නිවැරදි ඉලක්ක ගත පිළිතුරු ලිවිය යුතු ය.

- * තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව අදාළ කරුණු ඉදිරිපත් කළ යුතු ය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ ස්වභාවය පිළිබඳ ව ගුරුවරයා ගැඹුරු හා පුළුල් අවබෝධයකින් ද යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රවේශ විය යුතුය. ව්‍යාපාර අධ්‍යයනය දිනෙන් දින වෙනස් වන විෂය කරුණු රාශියකින් යුක්ත වේ. එමනිසා එම වෙනස්වීම් පිළිබඳ ව දැනුවත් වීමට ගුරුවරයා සමත් විය යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයයකි. එම නිසා එම විෂයයට ආදරය කිරීමටත් එම විෂය ක්ෂේත්‍රය තුළ ජීවත්වීමටත් (Love & Live) ගුරුවරයා සමත් විය යුතු අතර ඒ සඳහා සිසුන්ට මඟ පෙන්වීමක් ද කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය උගන්වන ගුරුවරයා පන්ති කාමරය තුළ සිදුවන සාමාන්‍ය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර චාරිකා, ව්‍යාපෘති, ප්‍රදර්ශන, ඉදිරිපත් කිරීම් වැනි ක්‍රියාකාරකම් විෂයය පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතුය. මෙම ක්‍රියාකාරකම්වලදී සිසුන්ගේ උපරිම සහභාගිත්වය සඳහා ඉඩ සැලසෙන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

* විෂය දැනුම තහවුරු කිරීමේදී පහසුකම් අනුව වීඩියෝ දර්ශන, පරිගණක මෘදුකාංග, අන්තර්ජාල භාවිතය වැනි අවස්ථාද බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර වැනි නවීන තාක්ෂණික උපක්‍රම ද භාවිත කිරීම වඩා සුදුසුය.

* විෂය අවබෝධය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන, වාර්ෂික අයවැය යෝජනා, විෂයයට අදාළ අණ පනත්, නියෝග, නීතිරීති ආයතනික පහසුකම් සපයන සංවිධානවල නිල ප්‍රකාශන පරිශීලනය කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයේ අභිමතාර්ථ පරීක්ෂා කිරීමේදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉටුකර ගත යුතු සුවිශේෂී අභිමතාර්ථ පද්ධතියක් ඇත. එම අභිමතාර්ථ ප්‍රධාන වශයෙන් එදිනෙදා ජීවිතයට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබාදෙන පරිදි සකස් කර ඇත. මීට අමතරව අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගෙන ජීවන පුරුදු බවට ඉගෙනුම් ඵලය සකස් විය යුතුය. එම අභිමතාර්ථ සාක්ෂාත් කරගත හැකිවන පරිදි ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉගැන්වීමේදී විවිධ ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරයා සැලකිලිමත් විය යුතුය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පෙන්වා දෙන මඟපෙන්වීම් ඔස්සේ ගුරුභවතා විසින් උචිත ක්‍රමවේද භාවිත කිරීම සාර්ථක ඉගෙනුම්- ඉගැන්වීම් වැඩ පිළිවෙළකට හේතුවනු ඇත.

* ගුරුවරයා තම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදී සිසුන් ඇගයීමට ලක්කළ යුතුය. පන්ති කාමරය තුළ ශිෂ්‍යයන් ඉගෙනීමෙහි යෙදී සිටින අතරතුරදී ගුරුවරයාට සිසුන්ගේ ඉගෙනුම් හැකියා, නොහැකියා හා ප්‍රවීණතා පිළිබඳ ව අවබෝධ කරගැනීමට එමගින් හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදීම සිසුන්ගේ දුර්වලතා හඳුනා ගෙන ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ගුරුවරයා විසින් සැලසුම් සකසා ගත යුතුය.

* ගුරුවරයා තමන්ගේ දැනුම භාවිත කරමින් කුඩා සිද්ධි අධ්‍යයන නිර්මාණය කර ඒ සඳහා න්‍යායාත්මක දැනුම යොදා ගන්නා ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කිරීම තුළින් එවැනි ප්‍රශ්න සඳහා සිසුන් සූදානම් කළ හැකිය.